QUESTION BANK
YOUR E-LEARNING PARTNER

G.C.E. A/L

ගිණුම්කරණය
Accounting

මාසික අධ්‍යාපනික සඟරාව

WWW.QUESTIONBANK.LK - YOUR E-LEARNING PARTNER

Issue No-05
October 2021

විශේෂ පුනරීක්ෂණ අභ්‍යාස
Special Revision Kit

- ✓ LKAS 10 - වාර්තාකරන කාලච්ඡේදයට පසුව සිදු වූ සිදුවීම්
- ✓ පළමු ප්‍රශ්න පත්‍රය Paper 1
- ✓ දෙවන ප්‍රශ්න පත්‍රය Paper 2
- ✓ පළමු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු
- ✓ දෙවන ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු

මෙම සඟරාව සෑම මසකම 15 වන දින පාසල් ගිණුම්කරණය විෂය භාර ආචාර්යවරයාට තැපැල් මගින් ලැබීමට සලස්වන අතර පාසල් දරුවන්ට මෙහි මෘදු පිටපත (Soft Copy) පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසීම තුලින් නොමිලේ භාගත (Download) කළ හැක.

මාර්ග ගත සඟරාව භාගත කිරීම සඳහා පිවිසෙන්න

WWW.QUESTIONBANK.LK

FREE DISTRIBUTION ONLY
නොමිලේ බෙදාහැරීම සඳහා පමණි

QUESTION BANK
YOUR E-LEARNING PARTNER

Think Ahead ACCA

ACCA SRI LANKA APPROVED LEARNING PROVIDERS (ALP) AND COMPUTER BASED EXAM CENTERS (CBE).

Approved Learning Providers

* Achievers London Business School
* Icon Business School
* Alpha Business School (Pvt) Ltd
* Premier Partners
* Wisdom Institute for International Studies (Pvt) Ltd

Computer Based Exam Centers

* Achievers Lanka Business School
* Alpha Business School
* G A Academy (Pvt) Ltd
* Icon Business School (Pvt) Ltd
* Premier Partners Institute of Management

Before enrolling with ALP's Please contact ACCA Sri Lanka office

ACCA Sri Lanka. Block A, 18 Floor, 33, Parkland, Park street, Colombo 2,
Hotline - 11 2424801 or 0773874247
Email - info@lk.accaglobal.com

LKAS 10

අ.පො.ස (උ. පෙළ)

33 - ගිණුම්කරණය

නව නිර්දේශය

දැනුමෙන් සන්නද්ධ වූ අනාගත පරපුරක් බිහි කරනු වස් **QuestionBank.Lk** හා **ACCA (Sri Lanka)** ආයතන එක්ව සිදුකරන සමාජ සත්කාරයකි.මෙම සඟරාවේ ***E - කලාපය*** පහත වෙබ් පිටුව තුලින් භාගත (Download) කල හැක.

www.Questionbank.lk/CSR

මෙම පෙරහුරු ප්‍රශ්න පත්‍රය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණ අංශයේ ආදි සිසුන් කණ්ඩායමක් සහ වරලත් ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු එක්ව නිර්මාණය කර ඇත.මෙය පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රයක් වන අතර ඉලක්ක ගත හෝ අනුමාන ප්‍රශ්න පත්‍රයක් නොවේ.

අ.පො.ස (උ. පෙළ)

33 - ගිණුම්කරණය

නව නිර්දේශය

QUESTION BANK

YOUR E - LEARNING PARTNER

ප්‍රකාශනය හා අයිතිය

Questionbank.lk (Pvt) Ltd
No - 11
මයුර මාවත
බෙල්ලන්විල
බොරැලැස්ගමුව
T.P – 077 3125364
Email – questionbank.lk@gmail.com

අධීක්ෂන සහාය

ධනුෂ්ක මදුරංග
ACA, BSc. Accounting (Sp) J'pura
නාමල් දයාරත්න
BSc. Administration (Sp) J'pura
දිමුතු මධුසංක
CBA, BSc. Accounting (Sp) J'pura
අෂාන් චන්දිමාල්
BSc. Accounting (Sp) J'pura
ලහිරු බණ්ඩාර
BSc. Finance (Sp) J'pura

නිර්මාණකරණය

ගයාන් රුකාන්ත
Dip in Graphic Design

පෙරවදන

ශ්‍රී ලංකා විභාග දෙපාර්මේන්තුව (2019) දී නිකුත් කල මූලාකෘති ප්‍රශ්න පත්‍ර ආකෘතිය සහ (2020) අ.පො.ස උසස් පෙල විභාග ප්‍රශ්න පත්‍ර ආකෘතිය අනුව මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත.වරලත් ගණකාධිකාරිවරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කිරීම තුලින් ඉහල ගුණාත්මක තත්වයක් ආරක්ෂා කිරීමට අප බලාපොරොත්තු වුනෙමු.ඉතා ඉහල ගුණත්වයකින් යුත් ඉගෙනුම් ආධාරක දැයේ දූ දරුවන්ට නොමිලයේ ලබා දීම තුලින් සියලුම දූ දරුවන්ට අධ්‍යාපනයට ඇති සම අයිතිය තහවුරු කිරීමටත්, අධ්‍යාපනයට ඇති සාම්ප්‍රදායික බාධා ඉවත් කිරීමට සහ ගුරුවරුන්ට බාධාවකින් තොරව සිය ඉගැන්වීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය සහාය ලබා දීම මෙම ව්‍යාපෘතිය තුලින් බලාපොරොත්තු වේ.

මෙම සගරාව සෑම මසකම 15 වන දින පාසල් ගිණුම්කරණය විශය භාර ආචාර්යවරයාට තැපැල් මගින් ලැබීමට සලස්වන අතර පාසල් දරුවන්ට සහ උපකාරක පන්ති ගුරුවරුන්ට මෙහි මෘදු පිටපත (Softcopy) පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසීම තුලින් නොමිලේ භාගත (Download) කල හැක.

www.questionbank.lk/CSR

විශය ගැටලුවක් නිරාකරණය කරගැනීමට හෝ මෙම සගරාවේ පවතින සංකීර්ණ විශය කරුණක් නිරාකරණය කරගැනීමට පහත දැක්වෙන Whatsapp අංකයට හෝ Facebook පිටුවට කෙටි පණිවිඩයක් යොමු කරන්න.
Facebook – QuestionBank.lk
WhatsApp – 077 3125674

www.questionbank.lk

වාර්තා කරන කාලපරිච්ඡේදයට පසුව සිදු වූ සිදුවීම් - LKAS 10

මෙම ප්‍රමිතයේ අරමුණ වන්නේ වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු ඇති වූ ගනුදෙනු හා සිද්ධීන් වාර්තා කරන කාලපරිච්ඡේදයට අදාලව ගැලපුම් කරන සිදුවීම් ද ගැලපුම් නොකරන සිදුවීම් ද යන්න හඳුනාගැනීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම වේ.

මෙහිදී ප්‍රමිතයට ආවේණික යෙදීම් වල නිවැරදි අර්ථ දැක්වීම් පිළිබඳ අවබෝධය ප්‍රමිතය අධ්‍යයනය කිරීම පහසු කරවයි.

සංකල්පය	නිර්වචන
වාර්තාකරන කාලච්ඡේදය ට පසු සිදුවීම්	වාර්තාකරන කාලච්ඡේදය ට පසු සිදුවීම් යනු, වාර්තාකරන කාලච්ඡේදයේ අවසාන දිනය හා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කරන දිනය අතර සිදුවන වාසිදායක සහ අවාසිදායක සිදුවීම් වේ. මෙහිදී ආකාර දෙකක් වශයෙන් සිදුවීම් හඳුනාගත හැකිය. 1. ගැලපීම් කිරීමට අවශ්‍ය වන සිදුවීම් 2. ගැලපුම් සිදුකිරීම අවශ්‍ය නොවන සිදුවීම්
ගැලපීම් කිරීමට අවශ්‍ය වන සිදුවීම්	වාර්තාකරන දිනට පැවති තත්වයන් පිළිබඳ තවදුරටත් සාක්ෂි සපයන සිදුවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ තුළ ගැලපීම් සිදුකල යුතුය.
ගැලපුම් සිදුකිරීම අවශ්‍ය නොවන සිදුවීම්	වාර්තාකරන දිනට පැවති තත්වයට සෘජු සම්බන්ධයක් නොමැති, තවදුරටත් සාක්ෂි නොසපයන සිදුවීම් නොගලපන සිදුවීම් වේ.

www.questionbank.lk

LKAS 10 වාර්තා කරන දිනයට පසුව සිදුවූ නමුත්, වාර්තා කරන දින පැවති තත්වයට බලපෑම් කල හැකි සිදුවීම් සම්බන්ධයෙන් අදාල වේ.



වාර්තාකරන කාලච්ඡේදය ට පසු සිදුවීම්

වාර්තාකරන දිනට පැවති වත්කම් සහ වගකීම් වලට ගැලපීම් සිදුකල යුතු හෝ එම සිදුවීම් සම්බන්ධව හෙළිදරව් කිරීම් කළ යුතු සිදුවීම්, වාර්තාකරන දිනය සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කරන දිනය (එනම්, සංවිධානයෙන් පරිබාහිරව නිකුත් කිරීම සඳහා) අතර සිදුවිය හැකිය.

www.questionbank.lk

ගැලපීම් කිරීමට අවශ්‍ය වන සිදුවීම්

වාර්තාකරන දිනට පැවති තත්වයන් පිළිබඳ තවදුරටත් සාක්ෂි සපයන සිදුවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ තුළ ගැලපීම් සිදුකල යුතුය.

ඇතැම් අවස්ථාවලදී වත්කම් සහ වගකීම් වලට ගැලපීම් කිරීම ප්‍රමිතයෙන් අවශ්‍ය කෙරේ. ***"ව්‍යාපාරයක් වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු ගලපන සිද්ධීන් වල බලපෑම පිළිබිඹු වන සේ මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන ඇති අගයන්ට ගැලපීම් කල යුතුය. (LKAS 10) "***

www.questionbank.lk

වාර්තාකරන දිනට පැවති තත්වයකට වැඩිපුර සාක්ෂි සපයන සිද්ධියකට උදාහරණයක් වන්නේ ගනුදෙනුකරුවකු බුන්වත් වී ඇති විටෙක වර්ෂ අවසානයේ අය විය යුතු/ ලැබිය යුතු වෙළඳ මුදල ලබා ගත නොහැකි බව තහවුරු වීමය.

ප්‍රමිතයේ සදහන් පරිදි, වාර්තාකරන දිනට පසු අස්තිත්වයේ මෙහෙයුම් ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය පිරිහී ඇත්නම් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී **අඛණ්ඩ පැවැත්ම පිළිබද උපකල්පනය** නැවත සලකා බැලීම ඉතාමත් යෝග්‍ය වේ.

ගලපන සිදුවීම් සඳහා වෙනත් උදාහරණ

- වර්ෂ අවසානයට පෙර සිදුවූ, දේපල වටිනාකමේ ස්ථිර ලෙස පහත වැටීම්.
- වසර අවසානයේ පැවති ධාරණ අගයට වඩා අඩු අගයකට තොග, වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු විකිණීම
- වසර අවසානයේ අය විය යුතුව තිබූ ශේෂයක් සහිත ගනුදෙනුකරුවකු බුන්වත් වීම
- වසර අවසානයේ සාකච්ඡා කරමින් තිබූ නෛතික රක්ෂණ හිමිකමකට අදාලව මුදල් ලැබීම හෝ ගෙවීම
- වාර්තාකරන කාලච්ඡේදයට පෙර මිලදි ගත් වත්කම්වල පිරිවැය හෝ විකුණන ලද වත්කම් සඳහා ලැබෙන මුදල වාර්තාකරන දිනෙන් පසුව තීරණය කිරීම
- වර්ෂය අවසානයට පෙර දිගු කාලීන ආයෝජනයක වටිනාකමේ ස්ථිර ලෙස පහත වැටීමකට සාක්ෂි පැවතීම
- මූල්‍ය ප්‍රකාශන අසත්‍ය බවට පෙන්නුම් කරන අන්දමේ වංචා හෝ වැරදි සොයා ගැනීම

www.questionbank.lk

ගැලපුම් සිදුකිරීම අවශ්‍ය නොවන සිදුවීම්

වාර්තාකරන දිනට පැවති තත්වයන්ට බලපෑම් ඇති නොකරන සිද්ධීන් සඳහා ගැලපුම් නොකල යුතු අතර ඒවා මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කල යුතුය.

"ව්‍යාපාරයක් විසින් වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු නොගලපන සිද්ධීන්වල බලපෑම පිළිබිඹු වන සේ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන ඇති අගයන්ට ගැලපීම් නොකල යුතුය."(LKAS 10)

මෙවැනි සිදුවීමකට ප්‍රමිතයෙන් දී ඇති උදාහරණයක් ලෙස, ආයෝජනයක වෙළඳපොළ අගය වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානය හා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය දෙන ලද දිනය අතර තුර සිදුවන පහල යෑමක් හඳුනාගත හැක. වෙළඳපොළ අගය අඩුවීම ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ තුල හට ගත් තත්වයක් නිරූපනය කරන අතර වාර්තාකරන දිනට පෙර පැවති තත්වයක් පෙන්නුම් නොකෙරේ. එබැවින් මූල්‍ය ප්‍රකාශන තුළ ආයෝජනයේ වෙළඳපොළ අගයට ගැලපුම් සිදුකිරීම යෝග්‍ය නොවේ. කෙසේ වෙතත් හෙළිදරව් කිරීම් මගින්, වාර්තාකරන දිනට පසු පැවති වත්කම් හා වගකීම් වල සිදුවූ අසාමාන්‍ය, ප්‍රමාණාත්මක වෙනස් වීම් නිරූපනය කිරීම පරිශීලකයනට අවශ්‍ය වේ.

නොගලපන සිදුවීම් සඳහා වෙනත් උදාහරණ වලට පහත සඳහන් ඒවාද ඇතුලත් කල හැකිය.

- වර්ෂ අවසානයට පසු පරිපාලිතයක් (Subsidiary) අත්පත් කර ගැනීම හෝ ඉවත් කිරීමක්
- මෙහෙයුමක් නතර කිරීමට අදාලව සැලසුමක් ප්‍රකාශයට පත් කිරීමක්
- වත්කම්වලට අදාලව විශාල මිලදී ගැනීමක් හෝ ඉවත් කිරීමක්
- වාර්තා කරන කාලපරිච්ඡේදයට පසුව පිරියත ගින්නෙන් විනාශ වීමක්
- වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානයට පසුව සිදුවූ කොටස් ගනුදෙනුවක්
- ආයතන ව්‍යුහය මහා පරිමාණයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කිරීමේ නිවේදනයක්
- වාර්තාකරන කාලපරිච්ඡේදයේ අවසාන දිනට පසුව ආරම්භ වූ නඩු හබයක්

කෙසේ වෙතත්, **ප්‍රමාණාත්මක, නොගලපන සිදුවීම්**, මූල්‍ය ප්‍රකාශන තුල සටහන් ආකාරයෙන් හෙළිදරව් කල යුතු බව සැලකිය යුතුය.

www.questionbank.lk

නිදසුන් 01
www.questionbank.lk

වාර්තාකරන කාලපරිච්ඡේදයට පසුව සිදුවූ පහත සඳහන් සිදුවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ තුළ වත්කම් සහ වගකීම් වලට ගැලපුම් කළ යුතුද යන්න පිළිබඳව සටහන් කරන්න.

(අ) ආයෝජනයක් මිලදී ගැනීම

(ආ) සැලකිය යුතු අලුත්වැඩියා පිරිවැයක් ජංගම නොවන වත්කමක් ලෙස ප්‍රාග්ධනිතකල යුතු බවට හඳුනා ගැනීම

(ඇ) විශ්‍රාම ප්‍රතිලාභවල වැඩිවීමක්

(ඈ) ගින්නක් නිසා ඇතිවූ අලාභයක්

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල තිබූ ප්‍රතිපාදනයකට වඩා වැඩියෙන් හානි සඳහා ගෙවීම් සිදුකර උසාවියේ පැවති නඩුවක් සමථයකට පත්කර ගැනීම.

(ඊ) තොග ඒවායේ ධාරණ අගයට (පිරිවැයට) වඩා අඩුවෙන් විකිණීම.

(උ) දිගුකාලීන වත්කමක් ලෙස පැවති දේපලක වටිනාකම හදිසියේ පහත වැටීම.

පිළිතුර
www.questionbank.lk

(ආ), (ඉ) සහ **(ඊ)** සඳහා ගැලපුම් අවශ්‍ය කෙරේ.
(ආ) වැරැද්ද නිවැරදි කිරීම - අලුත්වැඩියා වියදම් හර කිරීම,
ජංගම නොවන වත්කම් බැර කිරීම
(ඉ) ප්‍රතිපාදනය වැඩි කිරීම - වියදම් හර කිරීම,
ප්‍රතිපාදනය බැර කිරීම

(ඊ) ශුද්ධ උපලබ්ධි අගය (1/1/) පිරිවැයට වඩා අඩුවන බවට සාක්ෂි පැවතීම - විකුණූ භාණ්ඩ වල පිරිවැය හර කිරීම,
තොගය බැර කිරීම

අනිකුත් අයිතම අතුරින්,

(අ) හෙළිදරව් කිරීමට කිසිසේත්ම අවශ්‍ය නොවේ.

(ඇ) අයිතම සම්බන්ධයෙන් සමාගමේ පිරිවැය ප්‍රමාණාත්මක විය හැකි නම් (ඇ) අයිතමය සඳහා හෙළිදරව් කිරීමක් අවශ්‍ය විය හැකිය.

(ඈ) අයිතමය ප්‍රමාණාත්මක නම් හෙළිදරව් කිරීමක් අවශ්‍ය විය හැකිය.

(උ) අයිතමය ප්‍රමාණාත්මක නම් හෙළිදරව් කිරීමක් අවශ්‍ය විය හැකිය.

සියලු ම හිමිකම් ඇවරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

ගිණුම්කරණය | 33 S I | **පැය දෙකයි**

උපදෙස්:

- ⋆ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ⋆ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ⋆ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ⋆ සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ.
- ⋆ විභාග අංකය ඉහලින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ⋆ වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

විභාග අංකය :...

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

	අත්සන	සංකේත අංකය
1 වන පරීක්ෂකගේ		
2 වන පරීක්ෂකගේ		
අති ප්‍රධාන පරීක්ෂකගේ		
ගණිත පරීක්ෂකගේ		
ප්‍රධාන පරීක්ෂකගේ		

I පත්‍රය සඳහා	
ප්‍රශ්න අංකය	ලකුණු
1 - 30	
31 - 50	
එකතුව	

1. පහත දැක්වෙන කුමන ප්‍රකාශය මූලා ගිණුම්කරණයේ වැදගත්කම වඩාත් හොඳින් විස්තර කරන්නේ ද?

www.questionbank.lk

1) තීරණ ගැනීමට කළමනාකරුවන්ට අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීමයි.
2) ව්‍යාපාරයේ වත්කම් භාවිත කල ආකාරය පිළිබඳව කළමණාකරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයීම.
3) ව්‍යාපාරයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගනුදෙනු හා සිද්ධීන් පාදක වූ ආර්ථික තොරතුරු සපයයි.
4) ව්‍යාපාරයක ඉපැයීම් ශක්තිය හා මූල්‍ය තත්වය පිළිබඳ ව්‍යාපාර අභ්‍යන්තර පාර්ශව දැනුවත් කිරීම.
5) ගිණුම්කරණ ඒකකයට අදාළ සියලුම තොරතුරු ඇල්මැති පාර්ශවයන්ට සැපයීමයි

2. SB තොග වෙළඳසැලේ ආරම්භක තොගයේ වටිනාකම රු. 20,000 කි. වර්ෂ අවසානයේ බැංකුවේ තැන්පත් කර ඇති මුදලට විකුණුම් රු. 60,000 කි. සෑම මසකම රු. 2,000 බැගින් විකුණුම් වලින් ලද මුදලින් ඒවා බැංකු ගත කිරීමට පෙර වෙළඳ ව්‍යාපාරයේ වරිපනම් හා කඩ කුලී ගෙවා ඇත. වර්ෂය තුළ ශුද්ධ ගැනුම් රු. 48,000 ක් වූ අතර රු. 4,000 ක තොග ආපසු යවා ඇත. ලාභ ආන්තිකය පිරිවැය මත 33 1/3% කි.

වර්ෂය තුළ ඉපැයූ දළ ලාභය හා වර්ෂ අවසාන තොගය වන්නේ (පිළිවෙලින්),

1) රු. 21,000 / රු. 5,000 2) රු. 21,000 / රු. 1,000 3) රු. 5,000 / රු. 21,000
4) රු. 28,000 / රු. 12,000 5) රු. 1,000 / රු. 21,000

3. 2021 දෙසැම්බර් මාසයේ වෙළඳ ව්‍යාපාරයක පහත ගණුදෙනු සිදු වී ඇත.

www.questionbank.lk

- ණයපත් (Credit cards) මගින් විකුණුම් රු. 700,000
- අත්පිට විකුණුම් රු. 500,000 (මුදල් ව්‍යාපාරයේ කවුන්ටරය වෙත මුදල් ලැබුණි.)
- ණයට විකුණුම් රු. 300,000 (මුදල් ව්‍යාපාරයේ කවුන්ටරය වෙත මුදල් ලැබුණි.)
- ලැබිය යුතු ගිණුම් වල ආරම්භක ශේෂයන් රු. 120,000
- ලැබිය යුතු ගිණුම් වල අවසාන ශේෂයන් රු. 100,000

සියළුම මුදල් ලැබීම් ඔවුන්ගේ බැංකු ගිණුමේ තැන්පත් කිරීම ව්‍යාපාරික ප්‍රතිපත්තියයි. 2021 දෙසැම්බර් බැංකුගත කළ මුදල වන්නේ,

www.questionbank.lk

1) රු. 820,000 2) රු. 680,000 3) රු 1,520,000
4) රු. 320,000 5) රු. 500,000

4. 2021.04.01 දින අනුර තම ව්‍යාපාරයේ කටයුතු සඳහා ඔහු සතු රු. 3,500,000 ක ලොරි රථය යොදවන ලදී. එදින රු. 800,000 ක තොග ණයට විකුණූ අතර රු. 60,000 ක භාණ්ඩ ඇණවුමට අනුකූල නොවූ නිසා හරවා එවා ඇත. මෙම ගණුදෙනු සටහන් කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලියවිලි අනුපිළිවෙලින්,

1) විකුණුම් ඉන්වොයිසිය, බැරපත, ලදුපත
2) ලදුපත, ජ'නල් වවුචරය, ගැණුම් ඉන්වොයිසිය
3) ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, හරපත
4) ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, බැරපත
5) ලදුපත, විකුණුම් ඉන්වොයිසිය, බැරපත

5. සමීර විසින් තම පෞද්ගලික මුදලින් රු. 60,000 ක් ගෙවා ව්‍යාපාරයේ බැංකු අයිරාව පියවා දමන ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්නේ,

1) රු. 60,000 කින් වත්කම් වැඩිවීම සහ 60,000 කින් වගකීම් වැඩිවීම ලෙසය
2) රු. 60,000 කින් හිමිකම් වැඩිවීම සහ 60,000 කින් වත්කම් වැඩිවීම ලෙසය
3) රු. 60,000 කින් හිමිකම් වැඩිවීම සහ 60,000 කින් වගකීම් අඩුවීම ලෙසය
4) රු. 60,000 කින් හිමිකම් වැඩිවීම සහ 60,000 කින් ආදායම් අඩුවීම ලෙසය
5) රු. 60,000 කින් වත්කම් අඩුවීම සහ 60,000 කින් හිමිකම් අඩුවීම ලෙසය

6. පහත තොරතුරු තොග වෙළෙඳසැලක 2021.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාල වේ.

www.questionbank.lk

	රු. 000
ආරම්භක තොගය	4,800
අවසාන තොගය	3,100
හානිවූ තොගය	1,600
ගැණුම්	59,500

මෙම තොරතුරු පදනම්කරගත් දළ ලාභය රු. 6,720,000 කි. මෙම ගණනයේදී අවසාන තොගය 112,000 කින් අධි ගණනය වී ඇති අතර ආරම්භක තොගය 256,000 කින් අවතක්සේරු වී ඇත. 2021.03.31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ නිවැරදි දළ ලාභය වන්නේ,

1) රු. 6,352,000 2) රු. 6,576,000 3) රු 7,088,000
4) රු. 6,208,000 5) රු. 6,325,000

7. සමාගමක 2021 මාර්තු මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

දිනය	**විස්තරය**	**ඒකක**	**ඒකක පිරිවැය**
2021.03.01	තොගය	3,000	10
2021.03.05	ගැනුම්	1,000	12
2021.03.15	ගැනුම්	2,000	15
2021.03.16	ආපසු යැවුම් (2021.03.15 මිලදීගත් භාණ්ඩ වලින්)	200	?

2021 මාර්තු මාසය තුළ භාණ්ඩ ඒකක 3,500 ක් විකුණා ඇති අතර සමාගම තොග නිකුත් කිරීම මිල කිරීමේදී පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය භාවිතා කරයි.

www.questionbank.lk

2021.03.31 දිනට තොගයේ වටිනාකම කීයද?

1) රු. 27,000 කි　2) රු. 30,000 කි　3) රු. 33,000 කි
4) රු. 36,000 කි　5) රු. 38,000 කි

පහත දී ඇති තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්න ද්විත්වය සඳහා පිළිතුරු සපයන්න.

www.questionbank.lk

	රු.
ණයගැතියන්ගේ අඩුවීම	60,000
ණයහිමියන්ගේ වැඩිවීම	40,000
තොගය අඩුවීම	15,000

2020/2021 වර්ෂයේ ණයහිමියන්ගෙන් රු. 10,000 ක වට්ටමක් ලද අතර ණයගැතියන්ට දුන් වට්ටම් රු. 15,000 කි. ආපසු එවුම් රු. 5,000 ක් වන විට ආපසු යැවුම් රු. 8,000 ක් විය. මුදලට ගැණුම් රු. 110,000 කි. ණයට ගැනුම් රු. 120,000 කි. අත්පිට විකුණුම් රු. 150,000 කි. ණයට විකුණුම් රු. 190,000 කි.

8. 2020/2021 වර්ෂයේ ණයගැති ලැබීම් ප්‍රමාණය වන්නේ,

1) රු. 210,000　2) රු. 180,000　3) රු 260 ,000
4) රු. 230,000　5) ඉහත කිසිවක් නොවේ

9. 2020/2021 වර්ෂයේ ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතය වන්නේ, (ආසන්න වශයෙන්)

1) පිරිවැය මත 10%　2) පිරිවැය මත 29%　3) විකුණුම් මත 20%
4) විකුණුම් මත 29%　5) ඉහත කිසිවක් නොවේ

10. සීමිත අශෝක පොදු සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කරන ලද මුළු විස්තීර්ණ ආදායම රු. 600,000 ක් විය. නමුත් එය ගණනය කිරීමේදී පහත වැරදි සිදු වී ඇති බව පසුව අනාවරණය විය.

www.questionbank.lk

- අවසාන තොගය ගණනය කිරීමේ දී පිරිවැය රු. 20,000 ක් වූ තොගයක් මගහැරී තිබුණි.
- රු. 40,000 ක පොලී ආදායම, පොලී වියදමක් ලෙස සටහන් කර ඇත.
- ප්‍රථම වර ඉඩම් ප්‍රත්‍යාගණනයේදී හටගත් රු. 100,000 ක ප්‍රත්‍යාගණන අලාභය සටහන් කර නොමැත.
- පෙර වර්ෂයේ කපාහළ රු. 30,000 ක බොල්ණය නැවත ලැබීම ණයගැති පාලන ගිණුමට බැර කර මුදල් ගිණුමට හර කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි මුළු විස්තීර්ණ ආදායම වන්නේ,

1) රු. 600,000 කි　2) රු. 610,000 කි　3) රු. 620,000 කි
4) රු. 630,000 කි　5) රු. 640,000 කි

11. ආයතනයක 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

අමුද්‍රව්‍ය තොග	2020.04.01 දිනට	25,000
	2021.03.31 දිනට	20,000
අමුද්‍රව්‍ය මිලට ගැනීම්.		80,000
පරිවර්ථන පිරිවැය.		120,000
ඍජු ශ්‍රම පිරිවැය		30,000
පොදු කාර්ය පිරිවැය		90,000
2020.04.01 සිට 2021.03.31 දක්වා නොනිමි තොගයේ වැඩිවීම		30,000

2021.03.31 න් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

www.questionbank.lk

1) රු. 205,000　2) රු. 175,000　3) රු 200,000
4) රු. 235,000　5) රු. 240,000

12. 2021 මාර්තු 31 දිනට අයාරත්නගේ මුදල් පොතේ බැංකු ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය යන දෙකෙහිම එකම අගයක් පැවතුණි. කෙසේ වෙතත් ගනුදෙනුකරුවෙක් එදිනට පෙර සෘජුවම බැංකුවේ තැන්පත් කරන ලද රු. 1,200 ක් මුදල් පොතේ සටහන් කර තිබුණේ නැත. 2021 මාර්තු 31 දින මුදල් පොතේ බැංකු ශේෂය සහ බැංකු ප්‍රකාශයේ ශේෂය එක හා සමාන වීමට හේතුව පහත දැක්වෙන දෑ අතුරින් කුමක් විය හැකිද ?

www.questionbank.lk

1) මුදල් පොතේ සටහන් නොවූ ණයගැති ප්‍රේෂණ රු. 1,200
2) ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු. 2,400
3) තැන්පත් කළ එහෙත් උපලබ්ධි නොවූ චෙක්පත්වල එකතුව රු.1,200
4) ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 2,200 ක් වීම
5) ඉහත සඳහන් කිසිදු හේතුවක් අදාල නොවේ

පහත ප්‍රශ්න ද්විත්වය සඳහා පිළිතුරු සැපයීමට මෙම තොරතුරු භාවිතා කරන්න.

රුපියල් මිලියන 200 ක ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිතව 2019.04.01 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද සමාගමක් 2020/21 සහ 2019/20 යන වර්ෂ සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

විස්තරය	2020/21 (රු. මිලියන)	2019/20 (රු. මිලියන)
මුළු ආදායම	300	200
මුළු වියදම (ආදායම් බදු හැර)	180	240
ආදායම් බදු	40	-
ගෙවූ ලාභාංශ	20	-
ප්‍රත්‍යාගණන සංචිත (මාර්තු 31 දිනට)	30	-
මුළු වත්කම් (මාර්තු 31 දිනට)	300	210

13. 2020.03.31 දිනට මුළු වගකීම් කොපමණද ?

www.questionbank.lk

1) රු. මිලියන 10
2) රු. මිලියන 30
3) රු. මිලියන 40
4) රු. මිලියන 50
5) රු. රු. මිලියන 120

14. 2021.03.31 දිනට හිමිකම කොපමණද ?

1) රු. මිලියන 170
2) රු. මිලියන 190
3) රු. මිලියන 250
4) රු. මිලියන 230
5) රු. රු. මිලියන 240

15. වෙළඳ ව්‍යාපාරයක් විසින් කල්බදු පදනම මත ලබාගත් වත්කම් දෙකක් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

ගොඩනැගිල්ල	කල්බදු කාලය වර්ෂ 20 කි. ගොඩනැගිල්ලේ ප්‍රයොජනවත් ජීවිත කාලය වසර 45 කි.
මෝටර් වාහනය	කල්බදු කාලය වර්ෂ 1 කි. එහි ජීව කාලය වර්ෂ 5 යි.

මෙම ගොඩනැගිල්ල සහ මෝටර් වාහනය SLFRS 16 ප්‍රමිතයට අදාල වේද අදාල නොවේද යන්න දක්වන්න.

	ගොඩනැගිල්ල	**මෝටර් වාහනය**
1)	අදාල වේ	අදාල නොවේ
2)	අදාල වේ	අදාල වේ
3)	අදාල නොවේ	අදාල නොවේ
4)	අදාල නොවේ	අදාල වේ
5)	අදාල වේ	අවිනිශ්චිතය

16. සමාගමක් 2021.03.01 දින නව යන්ත්‍රයක් ආනයනය කළ අතර ඊට අදාළ තොරතුරු පහත දැක්වේ.

www.questionbank.lk

	රු.
යන්ත්‍රයේ මිල	600,000
ආපසු නොගෙවන ආදායම් බදු	100,000

ප්‍රවාහන පිරිවැය	200,000
වරාය ගාස්තු	50,000
වාර්ෂික නඩත්තු පිරිවැය	120,000

- යන්ත්‍රය සවිකිරීමේදී එය සවි කළ සේවකයාගේ වැරදීමකින් එහි කොටසක් විනාශ වූ අතර එය යථා තත්වයට පත් කිරීමට රු. 40,000 ක් දැරීමට සිදුවිය.

www.questionbank.lk

LKAS –16 (දේපළ, පිරියත හා උපකරණ) ට අනුව 2021.03.31 දිනට මෙම යන්ත්‍රයේ පිරිවැය කීයද?

1) රු. 950,000
2) රු. 970,000
3) රු. 990,000
4) රු. 1,000,000
5) රු. 1,100,000

17. තොග අයිතම තුනක් සඳහා 2021.03.31 දිනට පහත සඳහන් තොරතුරු සමාගමක් විසින් සපයා ඇත.

අයිතම	**නිෂ්පාදන පිරිවැය**	**අපේක්ෂිත විකුණුම් ආදායම (රු)**	**අපේක්ෂිත විකුණුම් වියදම (රු)**
A	13,000	15,000	5,000
B	10,000	16,000	4,000
C	17,000	19,000	7,000

අයිතම ක්‍රමය අනුව 2021.03.31 දිනට තොගයේ වටිනාකම කුමක්ද?

1) රු. 32,000
2) රු. 34,000
3) රු. 40,000
4) රු. 42,000
5) රු. 50,000

18. LKAS 2 (තොග) ප්‍රමිතියට අදාළව පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වන්නේද?

www.questionbank.lk

A. තොග මැනීම සිදුකල යුත්තේ තොගයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් වඩා අඩු අගයටය.
B. ඍජු අමුද්‍රව්‍ය පිරිවැය පරිවර්තන පිරිවැයට අයත් වේ.
C. කර්මාන්ත පරිපාලන පිරිවැය තොග වලට අයත් නොවේ.

1) A පමණි
2) B පමණි
3) A හා C පමණි
4) B හා C පමණි
5) A, B හා C යන සියල්ලම

19. ප්‍රතිපාදනයන්, අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියට (LKAS 37) අනුව නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.

1) ප්‍රතිපාදනයක් යනු කාලය හෝ ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවයක් සහිත බැරකම් වේ.
2) ප්‍රතිපාදනයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීමක් ලෙස පෙන්නුම් නොකළ යුතුය.
3) අසම්භාව්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වත්කම් ලෙස පෙන්නුම් නොකළ යුතුය.
4) අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම් ලෙස පෙන්නුම් නොකළ යුතුය.
5) ආයතනයෙහි පාලනයෙන් තොරව අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සිදුවීම හෝ නොවීම මත ඇති විය හැකි වගකීම් අසම්භාව්‍ය වගකීම් වේ.

20. ව්‍යාපාරයක් බොල් ණය කපාහැරීම සහ අඩමාණ ණය වෙන්කිරීමට අදාළ සියළු ගැලපිළි බොල් හා අඩමාණ ණය වෙන්කිරීමේ ගිණුමක් තුළ සිදු කරයි. පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

www.questionbank.lk

- 2020.04.30 දිනට අඩමාන ණය වෙන්කිරීම රු. 44,000
- 2021.03.31 දිනට ණයගැතියෝ රු. 921,000 ක් වූ අතර එයින් රු. 21,000 ක ණයගැතියෙක් අයකරගත නොහැකි හෙයින් කපාහැරිය යුතුය
- පසුගිය වසරක කපාහල රු. 27,000 ක බොල්ණය සඳහා 2020/2021 වසරේදී මුදල් ලැබුණි.
- ණයගැති ශේෂයෙන් 10% ක් අඩමාණ ණය ලෙස වෙන් කළ යුතුය.

2020/2021 වර්ෂයට බොල් හා අඩමාණ ණය ලෙස ලාභාලාභ ගිණුමට අයකළ යුතු වටිනාකම කොපමණද?
www.questionbank.lk

1) රු. 67,000 2) රු. 40,000 3) රු. 46,000
4) රු. 90,000 5) රු. 92,100

21. ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ තොරතුරු වල පැවතිය යුතු ගුණාත්මක ලක්ෂණ තුනක් නිවැරදිව දැක්වෙනුයේ,

1) විශ්වාසදායී බව, අදාළ බව, නිරවද්‍ය බව
2) අවබෝධ කරගත හැකි බව, සැසඳිය හැකි බව, සම්පූර්ණත්වය
3) අවබෝධ කරගත හැකි බව, විශ්වාසදායී බව, අදාළ බව
4) අදාළ බව, සැසඳිය හැකි බව, නිරවද්‍යතාවය
5) සම්පූර්ණත්වය, නිරවද්‍යතාවය, විශ්වාසදායී බව

22. බ්‍රයන් සමාගමේ 2021 වර්ෂයේ ණයගැතියන්ගෙන් මුදල් ලැබීම නිසා රු. 80,000 කින් කාරක ප්‍රාග්ධනය වෙනස් විය. සියලුම ණයගැතියන්ට ලබාදුන් වට්ටම් අනුපාතය 10% කි. සියලුම ණයගැතියන්ට මෙම ප්‍රතිලාභය ලබාදී ඇත. 2021.12.31 දිනට ණයගැති අගය රු. 150,000 කි. එය වර්ෂයේ ණයට විකුණුම් වලින් 1/4 කි. 2021.01.01 දිනට ණයගැති ශේෂය වන්නේ,

1) රු. 600,000 2) රු. 350,000 3) රු. 900,000
4) රු. 150,000 5) රු. 275,000

23. දේපළ පිරියත හා උපකරණ ක්ෂය වීම වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනීමට පාදක වන ගිණුම්කරණ සංකල්පය,
www.questionbank.lk

1) ඒකක 2) අඛණ්ඩ පැවැත්ම 3) ආරක්ෂණ
4) උපලබ්ධි 5) උපචිත

24. පහත දැක්වෙන ගනුදෙනු අතරින් දැනට පවතින ජංගම අනුපාතය ඉහළ යාමට හේතුවන ගනුදෙනුව / ගනුදෙනු කාණ්ඩය වන්නේ,

A. ණයහිමියකු පියවීම
B. ලාභ ඇතිව අත්පිට විකිණීම
C. ණයට තොග මිලට ගැනීම

1) A පමණි 2) B පමණි 3) C පමණි
4) A හා B පමණි 5) A, B හා C යන සියල්ලම

25. සීමිත සෙලින්කෝ සමාගමේ 2021 නොවැම්බර් මස වැටුප් ලේඛනයෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

මූලික වැටුප	60,000	සේ.අ.අ. - සේවකයා (EPF)	8%
ණය වාරික	8,400	සේ.අ.අ. - සේව්‍ය (EPF)	12%
උත්සව අත්තිකාරම්	3,500	සේ.භා.අ. (ETF)	3%
අතිකාල දීමනා	4,200	දළ වැටුප	69,200
ප්‍රවාහන දීමනා	5,000		

සේ.අ.අ. ගණනය කරනු ලබන්නේ අතිකාල හැර දළ වැටුපටයි. අදාල මාසය සඳහා ශුද්ධ වැටුප හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතු සේ.අ.අ. වගකීම පිළිවෙලින්, (සේවක අර්ථ සාධක අරමුදලට කල යුතු ගෙවීම් සියල්ල ප්‍රවර්ථන මාසයට පසු මාසයේදි සිදුකරනු ලබයි)
www.questionbank.lk

1) රු. 52,100 / රු. 13,000 2) රු. 61,300 / රු. 14,840 3) රු. 52,100 / රු. 13,380
4) රු. 61,300 / රු. 12,000 5) රු. 81,000 / රු. 13,840

26. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.
www.questionbank.lk

විකුණුම්	රු. 4,000,000
ආදායම් බදු වියදම	රු. 80,000
පොලී වියදම්	රු. 60,000
කාලච්ඡේදයේ ලාභය	රු. 400,000

2021.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය කොපමණ ද?

	ශුද්ධලාභ අනුපාතය (%)	පොලී ආවරණ අනුපාතය (වාර)
1)	10	5
2)	10	9
3)	10	8
4)	5	9
5)	7.5	8

27. ආයතනයක් භාවිතා කරනු ලබන අමුද්‍රව්‍යකට අදාළ ව පහත තොරතුරු දී ඇත.

	උපරිම	අවම
පරිභෝජනය (ඒකක)	600	200
පොරොත්තු කාලය (සති)	6	3

මෙම අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම කොපමණ ද?

1) ඒකක 600 2) ඒකක 1,800 3) ඒකක 3,600
4) ඒකක 4,400 5) ඒකක 3,000

28. අයිතමයක නිෂ්පාදන ප්‍රමාණය වැඩි වන විට පහත කුමන ප්‍රකාශනය නිවැරදි ද?
www.questionbank.lk

1) ඒකකයක විචල්‍ය පිරිවැය අඩු වේ
2) ඒකකයක ස්ථාවර පිරිවැය අඩු වේ
3) මුළු පිරිවැය අඩු වේ
4) ඒකකයක ස්ථාවර පිරිවැය සහ ඒකකයක විචල්‍ය පිරිවැය වෙනස් නොවේ
5) ඒකකයක විචල්‍ය පිරිවැය වෙනස් නොවී පවතින අතර ඒකකයක ස්ථාවර පිරිවැය වැඩි වේ

29. පිරිවැය, පරිමා හා ලාභ (CVP) විශ්ලේෂණයේදී, දායකය යනු,

1) විකුණුම් ආදායම සහ ලාභය අතර වෙනස
2) විකුණුම් ආදායම සහ මුළු පිරිවැය අතර වෙනස
3) විකුණුම් ආදායම සහ ස්ථාවර පිරිවැය අතර වෙනස
4) විකුණුම් ආදායම සහ මුළු විචල්‍ය පිරිවැය අතර වෙනස
5) විකුණුම් ආදායම සහ විකුණුම් පිරිවැය අතර වෙනස

30. පිරිවැය වර්ගීකරණයට අදාළ ව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?
www.questionbank.lk

1) නිෂ්පාදිත පිරිවැය සමන්විත වන්නේ ඍජු පිරිවැයෙන් පමණි
2) සියලු ඍජු පිරිවැය, විචල්‍ය පිරිවැය වේ
3) යන්ත්‍ර ක්ෂය පාලනය කළ හැකි පිරිවැයක් ලෙස සලකනු ලබයි
4) පිරිවැය හැසිරීම මත ප්‍රධාන වශයෙන් විචල්‍ය සහ ස්ථාවර ලෙස වර්ග කරනු ලැබේ
5) තොග මැනීම සඳහා පිරිවැය, අදාළ සහ අදාළ නොවන ලෙස වර්ග කරනු ලැබේ

31. 2021.03.31 දිනට ආයතනයක මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙලින් රු. 1,000,000 ක් හා රු. 300,000 ක් විය. මෙම සංඛ්‍යා වලට එළඹීමේදී පහත වැරදීම් සිදු වී ඇත.

www.questionbank.lk

- 2021 අප්‍රේල් මාසයේදී භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් ලබාගත් රු. 20,000 ක අත්තිකාරම්, අයභාරය ලෙස හඳුනාගෙන තිබීම.
- 2021 මාර්තු මාසය සඳහා නොගෙවූ 5,000 ක විදුලි බිල වාර්තාවලින් මග හැරීම.
- රු. 10,000 ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ'නලයේ දෙවතාවක් වාර්තා කර තිබීම.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසුව මුළු වත්කම් ප්‍රමාණය හා මුළු වගකීම් ප්‍රමාණය ගණනය කරන්න.

a) මුළු වත්කම් ....
b) මුළු වගකීම් ....

32. සුළු මුදල් ප්‍රතිපූර්ණය කරන දිනයේ දී සුළු මුදල් භාරකරු ළඟ රු. 1,200 ක් ඉතිරිව තිබුණි. අයිතිකරු සිය පෞද්ගලික ප්‍රයෝජනයට ගත් රු. 400 ඇතුළත් ව රු. 6,800 ක් ගෙවීම් කර තිබුණි.

1. සුළු මුදල් අග්‍රිමය කොපමණ ද? ....
2. එම දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණ ද? ....

www.questionbank.lk

33. බේකරි අයිතම කිහිපයක් නිපදවන ආයතනයක පහත පිරිවැය මූලිකාංග සඳහා එක් උදාහරණය බැගින් දක්වන්න. (බේකරි අයිතම පිරිවැය ඒකකය ලෙස සලකන්න.)

සෘජු අමුද්‍රව්‍ය ....
වක්‍ර ශ්‍රමය ....
වක්‍ර වියදම් ....
වක්‍ර අමුද්‍රව්‍ය ....

34. මූලාශ්‍ර ලේඛන භාවිතයේ ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

1. ....
2. ....

35. විස්තීරන ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අතර වෙනස පහත කරුණු මත වෙන්කොට දක්වන්න

	විස්තීර්න ආදායම් ප්‍රකාශනය	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
පදනම	....	....
සපයන තොරතුරු වල ස්වභාවය	....	....

36. පහත කරුණු හේතුවෙන් බැංකු ප්‍රකාශනයේ ශේෂය, මුදල් පොතේ ශේෂයට සාපේක්ෂව වැඩි වේ ද, අඩු වේ ද යන්න දක්වන්න.

		වැඩි වේ/ අඩු වේ.
A.	නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්	....
B.	තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්	....
C.	මුදල් පොතේ සටහන් නොවූ ණයගැති සෘජු ප්‍රේෂණ	....
D.	මුදල් පොතේ සටහන් නොවූ බැංකු ගාස්තු	....

www.questionbank.lk

37. සීමිත නිලූ පොදු සමාගමේ 2020.04.01 දිනට පහත ශේෂ පැවතුණි.
www.questionbank.lk

	රු. '000
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 100,000)	2,000
රඳවාගත් ඉපැයුම්	800

2020.09.30 දින සමාගම් කොටසක් රු. 20 ක ප්‍රතිෂ්ඨාවකට රු. 400,000 ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. 2020.12.31 දිනට පැවති සෑම කොටස් 12 කටම 1 බැගින් කොටසක් රු. 10 ක ප්‍රතිෂ්ඨාවකට හිමිකම් නිකුතුවක් එදින සිදු කරන ලදී. දැනට සිටින කොටස් හිමියන් විසින් සියලුම හිමිකම් කොටස් සඳහා දායක වන ලදී. 2021.03.31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා ලාභය රු. 300,000 ක් විය. පහත දෑ සඳහන් කරන්න.

(අ) ඉහත කොටස් නිකුත් කිරීම් නිසා සිදුවූ මුදල් ශේෂයේ වැඩි වීම. රු . ...

(ආ) 2021.03.31 දිනට හිමිකම රු . ...

38. අදාළ තීරුවේ “X” ලකුණ යොදමින් පහත ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය බව දක්වන්න.
www.questionbank.lk

ප්‍රකාශය	සත්‍ය	අසත්‍ය
A. නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී සියලු පොදු කාර්යය පිරිවැය සැලකිල්ලට ගත යුතුය.	....	....
B. අඩමාණ ණය වෙන්කිරීම ආරක්ෂණ සංකල්පයට අනුකූල වේ.	....	....
C. අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය.	....	....
D. විකුණුම් ආදායමෙන් විචල්‍ය පිරිවැය අඩුකල විට සහභාගය ලැබේ.	....	....

39. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව "මූල්‍ය ක්‍රියාකාරකම්" නිර්වචනය කරන්න.

....

40. QB ක්‍රීඩා සමාජයේ 2020.04.01 දිනට සාමාජිකයන් 100 ක් සිටිය අතර එක් අයෙකුගේ මාසික සාමාජික මුදල රු. 100 ක් විය. 2020.04.01 දිනට හිඟහිටි සාමාජික මුදල රු. 6,000 ක් වූ අතර එම සාමාජිකයන්ගේ සාමාජිකත්වය 2020.04.01 දින අහෝසි කරන ලදී. ඔවුන් පසුගිය වර්ෂය සඳහාම සාමාජික මුදල් ගෙවා නොතිබුණි. 2021.10.01 දින නව සාමාජිකයන් 10 දෙනෙකු බඳවා ගන්නා ලද අතර 2021.03.31 දිනට හිඟහිටි සාමාජික මුදල රු. 10,000 ක් විය.
www.questionbank.lk

(අ) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම කීයද?

....

(ආ) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල කීයද?

....

41. ව්‍යාපාරයක රු. 40,000 ක තොගයක් ගංවතුරින් විනාශ විය. එම තොගය නැවත රු. 8,000 ක වියදමක් දරා රු. 38,000 කට විකිණිය හැකි බව ඇස්තමේන්තු කරන ලද අතර විකුණුම් කොමිස් ප්‍රමාණය විකුණුම් මිලෙන් 10% ක් නම් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය කොපමණ ද?
www.questionbank.lk

....

42. සාමාන්‍ය විකුණුම් වලට අමතරව විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද රු. 150,000 ක් පිරිවැය වූ හා රු. 180,000 ක් විකුණුම් මිල වූ භාණ්ඩ තොගයක් ණයට විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත. වර්ෂයේ ලාභය රු. 100,000 ක් වූ අතර එය ගණනය කිරීමෙන් අනතුරුව ඉහත 1/5 ක් ගිණුම් වර්ෂය අවසාන වන විට නොවිකිණී තිබූ බව හා ඒවා ආපසු එවීමේ කාලය ඉකුත් වී නොතිබූ බව හෙළිදරව් වී ඇත. වර්ෂයේ නිවැරදි ලාභය කොපමණ ද?

www.questionbank.lk

....

43. LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතියට අනුව සමාගමකට ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කළ හැකි අවස්ථා දෙක සඳහන් කරන්න.

1. ....

2. ....

44. නිෂ්පාදන සමාගමක පහත එක් එක් අවස්ථාවලට වඩාත් අදාළ වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

අවස්ථා	ගිණුම්කරණ සංකල්පය
A. වසර අග අමුද්‍රව්‍ය තොගය එහි පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මිනුම් කිරීම	....
B. සෑම ගිණුම් කාලච්ඡේදයක් සඳහාම නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීම	....
C. භාණ්ඩ භාරදීමට පෙර ගනුදෙනුකරුවකුගෙන් ලද අත්තිකාරමක් වගකීමක් ලෙස හඳුනා ගැනීම	....
D. යන්ත්‍රයක් මත වෙන් කරන ලද ක්ෂය, නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් ලෙස නිෂ්පාදන ගිණුමෙහි හඳුනා ගැනීම	....

45. සමාගමක් 2020.04.01 දින කල්බද්දක් යටතේ රු. 4,000,000 ක් සාධාරණ අගය වූ මෝටර් රථයක් අත්පත් කර ගත් අතර මූලික තැන්පතුව ලෙස රු. 1,600,000 ක් ගෙවන ලදී. වාර්ෂික කල්බදු වාරිකය රු. 930,000 ක් වූ අතර කල්බදු කාල සීමාව වසර 4 කි. මෙම මෝටර් රථයේ ඵලදායි ජීව කාලය වසර 5 ක් වන අතර කල්බදු කාල සීමාව අවසානයේදී මෝටර් රථයේ අයිතිය සමාගමට හිමි නොවේ. පළමු කල්බදු වාරිකය තුළ ඇතුළත් පොළිය රු. 480,000 ක් වූ අතර දෙවන කල්බදු වාරිකය තුළ ඇතුළත් පොළිය රු. 390,000 ක් විය.

www.questionbank.lk

(අ). 2021.03.31 න් අවසන් වර්ෂය සඳහා මෙම මෝටර් රථයේ ක්ෂය වියදම කීයද?

....

(ආ). මෙම ගනුදෙනුවට අදාළව 2021.03.31 දිනට සමාගමේ ජංගම නොවන වගකීම් කීයද?

....

46. ව්‍යාපාරයක කළමණාකරණ ගිණුම්කරණයේ කාර්යභාරය අදාලව පහත ප්‍රකාශ සත්‍ය අසත්‍ය බව දක්වන්න.

A. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශ කළමනාකරණ ගිණුම්කරණය මඟින් සපයයි. (.....................)
B. එය ව්‍යාපාරයක අතීත තොරතුරු පමණක් සපයයි (.....................)
C. එයින් මූල්‍ය ගිණුම්කරණයට තොරතුරු සපයයි (.....................)
D. එය ව්‍යාපාරයේ අතීත හා අනාගත තොරතුරු සපයයි (.....................)

47. සමාගමක් සතුව නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. සේවා දෙපාර්තමේන්තුවේ අයවැයගත පොදු කාර්ය පිරිවැය රු. 100,000 ක් වන අතර එය නිෂ්පාදන දෙපාර්තමේන්තු වැඩ කළ යන්ත්‍ර පැය ගණන මත පදනම්ව නැවත බෙදාහරිනු ලැබේ. පහත අතිරේක අයවැයගත තොරතුරු ද දී ඇත.

www.questionbank.lk

www.questionbank.lk

	නිෂ්පාදන දෙපාර්තමේන්තු I	නිෂ්පාදන දෙපාර්තමේන්තු II
යන්ත්‍ර පැය	7,000	3,000
ඒකකයක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	රු. 120	රු. 140
ඒකකයක සැකසුම් කාලය	යන්ත්‍ර පැය 3	යන්ත්‍ර පැය 2

නිෂ්පාදන දෙපාර්තමේන්තු I සඳහා පහත දෑ දක්වන්න.
(අ) නැවත විභාජනය කරන ලද සේවා දෙපාර්තමේන්තු පොදු කාර්ය පිරිවැය :රු..

(ආ) යන්ත්‍ර පැයකට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය : රු...

නිෂ්පාදන දෙපාර්තමේන්තු II සඳහා පහත දෑ දක්වන්න.
(ඉ) මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය : රු. ....

48. 2021 ජුනි මාසය සඳහා සමාගමක වැටුප් සාරාංශය පහත දී ඇත.

www.questionbank.lk

විස්තරය	රු.
මූලික වැටුප	100,000
දීමනා	25,000
සේවක අර්ථසාධක මුදල් අඩුකිරීම්	8,000
උත්සව අත්තිකාරම් අඩුකිරීම	7,000
ශුද්ධ වැටුප	110,000
සේව්‍ය අර්ථසාධක අරමුදල් දායකය	12,000

ජුනි මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදාළ මුලු වියදම කොපමණද? ....

49. පහත එකිනෙක අවස්ථා නිසා ආයෝජන ව්‍යාපෘතියක පිළිගෙවුම් කාලය වැඩි වේ ද, අඩු වේ ද, වෙනස් නොවේ ද යන්න දක්වන්න.

	වැඩි වේ/ අඩු වේ /වෙනස් නොවේ
A. ආරම්භක ආයෝජනය ඉහළ යාම	....
B. වාර්ෂික මුදල් ගලා ඒම් පහළ යාම	....
C. වාර්ෂික මුදල් ගලා යාම් පහළ යාම	....
D. වට්ටම් අනුපාතය ඉහළ යාම	....

50. සමාගමක් විසින් රු. 2,400,000 කට යන්ත්‍රයක් මිලදී ගැනීමට සලකා බලමින් සිටී. එහි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙලින් වසර 5 ක් සහ රු. 600,000 ක් වේ. ක්ෂය වෙන්කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කරනු ලබයි. මෙම යන්ත්‍රයන් රු. 600,000 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් සෑම වර්ෂයක දී අපේක්ෂා කෙරේ.
පහත දෑ ගණනය කරන්න.

www.questionbank.lk

(අ). පිළිගෙවුම් කාලය (වසර)...

(ආ).ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය - සාමාන්‍ය ආයෝජනය මත පදනම් ව (%).......................................

සියලු ම හිමිකම් ඇවිරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

ගිණුම්කරණය | 33 S II | **පැය තුනයි**

අමතර කියවීම් කාලය - මිනිත්තු (10) යි
Additional Reading Time - 10 minutes

විභාග අංකය :..

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිලිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න

වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගනක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස්

* **පලමුවන** හා **දෙවන** ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිලිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිලිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාල පෙරවැඩ, පිලිතුරු පත්‍රය සමග අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

01. සීමිත විරාජනී පොදු සමාගමේ 2021.03.31 දිනට පහත තොරතුරු ලබා දී ඇත.

www.questionbank.lk

ශේෂ පිරික්සුම

	(රු.000)	(රු.000)
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් (200,000)		5,000
පොදු සංචිතය		500
රඳවාගත් ලාභ		300
ගැණුම් හා විකුණුම්	4,000	6,000
ආරම්භක තොගය	400	
වෙළඳ ලැ/යු හා වෙළඳ ගෙ/යු	2,300	900
ගෙවූ ආදායම් බදු (2020/21)	250	
2020.04.01 අඩමාණ ණය වෙන් කිරීම		300
වැටුප් හා වේතන	270	
අනෙකුත් පරිපාලන වියදම්	420	
බෙදා හැරීම් වියදම්	160	
ණයකර පොලී	75	
20% ණයකර (2020.09.30 නිකුත් කරන ලද)		1,000
ගෙවූ අතුරු ලාභාංශ	200	
තාවකාලික වත්කම් ගිණුම	150	
වත්කම් විකුණුම් ලාභ		300
දේපල පිරියත උපකරණ	2,420	
සම්මුචිත ක්ෂය වෙන් කිරීම		640
ආයෝජන ආදායම් ලැබීම		25
15% ආයෝජන	560	
බැංකු හා මුදල්	3,732.5	
ඉදිරියට ගෙවූ වියදම්	57.5	
ගෙවූ ආදායම් බදු හා වෙන් කිරීම් (2019/20)	320	350
	15,315	**15,315**

www.questionbank.lk

අතිරේක තොරතුරු,
www.questionbank.lk

I. 2021.03.31 දින සිදු කරන ලද තොග ආගණනයේ දී පහත දැක්වෙන මාර්ගස්ථ තොග මඟ හැරී ඇත. පහත තොග හැරුණු විට රු. 120,000 ක් පිරිවැය වූ තොගයක් ආයතනයේ පැවතිණි.

අයිතමය	පිරිවැය	ශුද්ධ උපලබ්ධි අගය
A	300,000	260,000
B	400,000	390,000
C	220,000	400,000

ආයතනය අයිතම් ක්‍රමය භාවිතයෙන් තොග ගිණුම්ගත කරනු ලැබේ.

II. 2019.04.01 දින අත්පිට මිල දී ගත් රු. 400,000 ක වටිනාකමක් සහිත මෝටර් රථයක් වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති බව 2020.10.31 දින 2019/20 වර්ෂයේ විගණනයේ දී හෙළිදරව් විය. ආයතනය මෝටර් රථ වර්ෂයකට 10% බැගින් සරළ මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කරනු ලබන අතර මෙම රථයේ සුන්බුන් අගයක් නොමැත.

III. ආයතනය 2020.09.30 දින එදිනට වර්ෂ දෙකකට පමණ පෙර මිලදී ගත් එදිනට ශුද්ධ අගය 350,000 ක් වූ මෝටර් රථයක් රු. 300,000 කට විකුණන ලදී. එම ලැබුණු මුදල් ලාභ ලෙස සටහන් කිරීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

IV. ආයතනයේ දේපල පිරියත හා උපකරණ 2020.04.01 දිනට පහත පරිදි වේ.
www.questionbank.lk

අයිතමය	පිරිවැය	සමුච්චිත ක්ෂය	ක්ෂය අනුපාතය
ඉඩම්	1,000,000	-	-
ගො/නැ	500,000	200,000	20%
මෝටර් රථ	800,000	420,000	10%
ලී බඩු	120,000	20,000	15%

ආයතනය සරල මාර්ග ක්‍රමයට අනුව ක්ෂය කරනු ලැබේ.

V. 2020.09.30 දින ගො/නැ 420,000 කට ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලදී. එදිනට ගො/නැ වල ඉතිරි ඵලදායි ජීව කාලය වසර 2.5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

VI. ආයතනය 2020.12.31 වන දින සුවිශේෂී වූ නිශ්පාදන යන්ත්‍රයක් කල්බදු ක්‍රමය යටතේ මිල දී ගන්නා ලදී. එම කල්බද්දට අදාල තොරතුරු පහත වේ.

- යන්ත්‍රයේ ගැණුම් මිලෙන් 80% කල්බදු ආයතනය ලබාදිය යුතුය.
- කල්බදු කාලය වසර 03 කි.
- යන්ත්‍රයේ ගැණුම් මිල රු. 750,000 කි.
- යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසර 04 ක් වන අතර ජීව කාලය අවසානයේ සුන්බුන් අගයක් නොමැත.
- ඵලදායි ජීව කාලය අවසානයේ දී යන්ත්‍රය ගලවා ඉවත් කිරිමට රු. 250,000 ක මුදලක් වැය වේ. (මෙම කාලපරිච්ඡේදය තුල මුදලේ කාල අගය නොවෙනස්ව පවතී)

වර්ෂ තුන සඳහා අදාළ කල්බදු පොලිය පහත පරිදි වේ.

2021/01/01 – 2021/12/31	-	70,000
2022/01/01 – 2022/12/31	-	30,000
2023/01/01 – 2023/12/31	-	20,000

ආයතනය විසින් ගෙවූ රු. 150,000 ක් තාවකාලික වත්කම් ගිණුමට හර කිරීම පමණක් මෙම ගනුදෙනුවට අදාළව වාර්තා කර ඇත. කල්බදු වාරිකයක වටිනාකම 240,000 ක් වන අතර සෑම වාරිකයක්ම දෙසැම්බර් 31 දින ගෙවිය යුතුය. කල්බද්ද අවසානයේ වත්කමේ හිමිකම ආයතනයට පැවරේ
www.questionbank.lk

VII. ශේෂ පත්‍ර දිනට පැවති රු. 30,000 ක ණයගැතියෙකු 2021.04.05 දින හෘදයාබාදයකින් මිය යන ලදී. වසර අග ණයගැති ශේෂය මත 10% ක් අඩමාණ ණය වෙන් කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

www.questionbank.lk

VIII. ආයතනය සේවක හා සේවා EPF/ETF නිසි පරිදි ගිණුම්ගත කර හෝ ගෙවා නොමැත. රජයේ රෙගුලාසි අනුව සේවායා EPF සඳහා 15% ක් ද ETF සඳහා 3% හා සේවකයිගෙන් 10% ක් ද දායක විය යුතුය. ශේෂ පිරික්සුමේ වැටුප් හා වේතන වලින් දැක්වුයේ ගෙවු ශුද්ධ වැටුප වේ.

IX. ආයතනය විසින් නිකුත් කරන ලද රු. 100,000 ක හරපතක් පොත් වලින් මඟ හැරී ඇත.

X. ආයතනයේ බදු අනුපාතය 30% ක් වන අතර නමුදු 2021.01.01 සිදු කරනු ලැබු බදු ප්‍රතිසංස්කරණ අනුව එම අනුපාතය 2021.01.01 සිට 20% ක් දක්වා පහත හෙලනු ලැබීය. (වර්ෂය පුරා ලාභ සමානව බෙදීයන බව උපකල්පනය කරන්න)

XI. අධ්‍යක්ෂ මණ්ඩලය පහත තීරණ වලට එළඹී තිබුණි.

- පොදු සංචිතයට 100,000 ක් මාරු කිරිම
- සාමාන්‍ය කොටස් හිමියන්ට කොටසකට රු. 10 ක ලාභාංශයක් ලබා දීම.

අවශ්‍ය වන්නේ,

LKAS 01 ප්‍රමිතයට අනුව අනුව ප්‍රසිද්ධ කිරිම සඳහා සී/ස විරාජනි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන,(සටහන් ද ඇතුලුව)

1. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය
3. 2021.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

02. (අ) පහත දැක්වෙන්නේ සසික මල්දෙණිය ව්‍යාපෘතියේ පසුගිය මාසයට අදාල පොදු කාර්යය පිරිවැය වේ.

www.questionbank.lk

උපකරණ ක්ෂය	12,000	වායු සමනය	7,800
කම්හල් ගොඩනැගිලි කුලී	10,000	සේවක රක්ෂණ	18,000
ආපනශාලා වියදම්	9,000	විදුලි ගාස්තු	2,000
වරිපනම්	1,000	බලය	5,000
තත්ව පාලන පිරිවැය	5,000	කම්හල් කළමණාකරුගේ වැටුප්	27,000

මෙම ව්‍යාපාරයේ නිෂ්පාදන හා සේවා දෙපාර්තමේන්තු සම්බන්ධව තොරතුරු

	නිෂ්පාදන දෙපාර්තමේන්තු		**සේවා දෙපාර්තමේන්තු**
	P	**Q**	ගබඩාව
භූමි වර්ගඵලය	1,200	1,600	1,200
පරිමාව(ඝන මීටර්)	4,000	6,000	3,000
සේවක සංඛ්‍යාව	40	30	20
උපකරණවල පොත් අගය	30,000	20,000	10,000
යන්ත්‍ර ධාරිතාව	12	8	-
ද්‍රව්‍යනිකුත්කිරීමේ අභියාචනාපත් සංඛ්‍යාව	60	40	-
තත්ත්ව පරික්ෂණ ගණන	20	30	-
විදුලි බුබුළු	6	8	6

අවශ්‍ය වන්නේ,

www.questionbank.lk

1. නිෂ්පාදන හා සේවා දෙපාර්තමේන්තු අතර පොදු කාර්යය පිරිවැය විභාජනය කිරීම සහ ගබඩා අංශයේ පොදු කාර්යය පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර විභාජනය කිරීම දැක්වෙන ප්‍රකාශනයක්

(ආ) වෙළෙඳ ආයතනයක ප්‍රදර්ශනාගාර සේවකයින්ගේ 2021 මාර්තු මාසය තුළ වැටුප් විස්තර පහත පරිදි වේ.

www.questionbank.lk

සේවකයාගේ නම	සතියේ දින වල වැඩ කළ පැය ගණන	සති අන්තයේ දිනවල වැඩ කළ පැය ගණන	මාර්තු 25 ලබා ගත් වැටුප් අත්තිකාරම් (රු.)	පැමිණීමේ මත වැටුප් (රු.)
නිම්ෂි	196	15	16,000	5,000
නිෂිනි	184	26	12,000	5,000
සිතුමි	140	30	13,000	-
එකතුව	520	71	41,000	10,000

I. සාමාන්‍ය මාසයක් තුළ පැය 160 ක් වැඩ කළ සේවකයෙකුට රු. 40,000 සමතල වැටුපක් හිමි වේ. සතියේ දිනවල අතිකාල පැයකට සාමාන්‍ය පැයක රේටය මෙන් 150% ක් හිමිවන අතර සති අන්තයේ දිනවල වැඩ කරන පැයකට සාමාන්‍ය පැයක රේටය මෙන් 200% ක් හිමි වේ.

II. 2021.03.01 ගිණුමේ ශේෂයන්

ගෙවිය යුතු වැටුප්	රු. 145,500
ගෙවිය යුතු EPF	රු. 24,000
ගෙවිය යුතු ETF	රු. 3,600

III. සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF) සඳහා මූලික වැටුප මත දායකයන් පහත පරිදි ගැලපුම් කළ යුතුය.

සේවක අර්ථසාධක - සේව්‍ය 12%
- සේවක 8%
සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල - සේව්‍ය 3%
සෑම මසකම EPF, ETF ගෙවනු ලබන්නේ ඊළග මාස 10 දිනය.

අවශ්‍ය වන්නේ,

www.questionbank.lk

1. වැටුප් ලේඛනය
2. 2021 මාර්තු මාසයට අදාළ සේවක වියදම්
   (එකිනෙක අයිතම වෙන වෙනම දක්වන්න)
3. පහත ලෙජර් ගිණුම
   I. ගෙවිය යුතු EPF ගිණුම
   II. ගෙවිය යුතු EPF ගිණුම
   III. ගෙවිය යුතු වැටුප් ගිණුම
   IV. වැටුප් පාලන ගිණුම

03. (අ) මොබිටෙල් සේවා ව්‍යාපාරයේ 2021.04.01 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය පහත පරිදි විය. ව්‍යාපාරය VAT ලියාපදිංචි වන අතර ව්‍යාපාරය විසින් සපයන සෑම සේවාවක් සඳහාම සපයන ලද සේවාවේ වටිනාකම මත 5% VAT ක් ගෙවිය යුතුය.

වත්කම්	**රු. 000**
කාර්යාල උපකරණ	250
(පිරිවැය 288,000)	
සේවා තොග	50
වෙළඳ ලැබිය යුතු දෑ	30
බැංකු	80
	410
හිමිකම	380
වගකීම්	
ගෙවිය යුතු VAT	10
වෙළඳ ගෙවිය යුතු දෑ	20
	410

2021 අප්‍රේල් මාසය තුලදී සිදු වූ ගණුදෙනු හා සිදුවීම් පහත පරිදි විය.

www.questionbank.lk

I	04/03	රු. 100,000 ක සේවා අත්පිට මුදලට සපයන ලදී.
II	04/05	ලකුණු කල මිල රු. 22,000 ක් වූ සේවා භාණ්ඩ තොගයක් රු. 20,000 කට ණයට ගන්නා ලදී.
III	04/08	04/05 දින ණයට ගත් භාණ්ඩ තොගයෙන් අඩක් නැවත සැපයුම්කරු වෙත හරවා යවන ලදී.
IV	04/12	වෙළඳ ලැබිය යුතු දැ වලින් රු. 10,000 ක වටිනාකමක් පියවීමට රු. 9,000 ක් ලැබුණු අතර ඉතිරිය වෙළඳ ලැබිය යුතු දැ මත හානිකරණ අලාභ ලෙස කපාහරින ලදී.
V	04/15	පිරිවැය රු. 45,000 ක් වූ කාර්යාල උපකරණ මිලට ගත් අතර එය ව්‍යාපාරයට ගෙන ඒමට රු. 3,000 ක් හා සවිකිරීම සඳහා රු. 2,000 ක වියදමක් දරන ලදී. මෙහි සුන්බුන් අගය රු. 2,000 ක් ලෙසත් ඵලදායී ජීව කාලය වසර 2 ක් බවත් මිලට ගත් දින තීරණය කල අතර මිලට ගත් දින සිටම එය භාවිතා කිරීමට හැකි විය. ව්‍යාපාරයේ පෙර සිට පැවති කාර්යාල උපකරණ වල ඵලදායී ජීව කාලය වසර 3 ක් වන අතර සුන්බුන් අගයක් නොමැත.
VI	04/18	මාසයට අදාල ව්‍යාපාරයේ ජල බිල්පත රු. 4,000 ක් වූ අතර එය පියවීම සඳහා ව්‍යාපාරය විසින් සේවාවක් සපයන ලදී.
VII	04/20	මාර්තු මාසයේදී සපයන ලද රු. 20,000 ක සේවාවක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත්වලින් අත්හැරී තිබුණි.
VIII	04/22	2021.04.01 දිනට පැවති වෙලද ගෙවිය යුතු දැ ශේෂය පියවීමට රු. 18,000 ක් මුදලින් ගෙවූ අතර ඉතිරිය වට්ටම් ලෙස සලකන ලදී.
IX	04/25	04/12 දින කපාහරින ලද වෙළඳ ගෙවිය යුතු දැ මත හානිකරණ අලාභ මුදලින් ලැබුණි.
X	04/30	මාසය සඳහා වූ රු. 3,000 ක විදුලි බිල ගෙවීම සඳහා අයිතිකරු පුද්ගලික මුදලින් රු. 2,000 ක් හා ඉතිරිය ව්‍යාපාරයේ මුදල් ද යොදා ගෙවා දමන ලදී.

අවශ්‍ය වන්නේ,

www.questionbank.lk

1. ඉහත ගණුදෙනු නිවැරදිව පහත ගිණුම්කරණ සමීකරණයට ගැලපීම.

කාර්යාල උපකරණ + සේවා තොග + වෙළඳ ලැබිය යුතු දැ + බැංකු = ගෙවිය යුතු VAT වෙළඳ ගෙවිය යුතු දැ + හිමිකම

2. 2021.04.30 න් අවසන් මාසය සඳහා ශුද්ධ වත්කම් මත පදනම්ව ලාභය හෝ අලාභය ගණනය කිරීම

(ආ) 2021 මාර්තු 31 දිනට පාලගේ ව්‍යාපාරයේ ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 80,000 ක් විය. එය ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව සමග එකඟ නොවිය. මෙම වෙනසට හේතු විමර්ශනයේ දී පහත තොරතුරු අනාවරණය විය.

I. ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුව පිළියෙල කිරීමේදී රු. 5,000 ක හර ශේෂයක් හා රු. 500 ක බැර ශේෂයක් මගහැරී ඇත.
II. කසුනිට ණයට විකුණුම් රු. 6,100 ක් විකුණුම් ජ'නලයේ සටහන් කර තිබුණේ රු. 1,600 ක් ලෙසය.
III. ණයගැති පාලන ගිණුමේ සටහන් කළ විකුණුම් තුල රු. 40,000 කට ණයට විකුණන ලද මෝටර් රථයක වටිනාකම ද ඇතුලත් ව ඇත.
IV. ණයගැතියෙකු වූ පියුම්ගෙන් ලැබුණු රු. 3,100, ඇයගේ ගිණුමේ රු. 1,300 ලෙස සටහන් කර තිබුණි.
V. රු. 3,000 ක ණයගැතියෙකුගෙන් ලද චෙක්පත අගරු වීම, ඔහුගේ ගිණුමේ පමණක් සටහන් කර ඇත.
VI. පොත් වලින් සම්පූර්ණයෙන්ම මගහැරී ඇති බැරපතේ වටිනාකම රු. 2,500 කි.
VII. ණයගැතියෙකුට දෙන ලද රු. 1,000 ක වට්ටමක් ව්‍යාපාරය විසින් අහිමි කර ඇති අතර, එය අදාළ ණයගැති ගිණුමේ පමණක් සටහන් කර ඇත.
VIII. ණයගැතියෙකු වූ සඳුනිගේ රු. 8,000 ක ශේෂය අයකර ගැනීමට නොහැකි බව තහවුරු වීම නිසා එය බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කල ද ඒ පිළිබඳ කිසිදු සටහනක් පොත්වල වාර්තා වී නොමැත.

අවශ්‍ය වන්නේ,

www.questionbank.lk

1. අදාල ගැළපීම් සමග ණයගැති පාලන ගිණුම
2. ඉහත ගැලපීම් සිදුකිරීමෙන් පසු ණයගැති පාලන ගිණුමේ ශේෂය හා ගැළපීම් කිරීමට පෙර ශේෂ ලැයිස්තුවේ එකතුව සංසන්දනය කිරීමේ ලේඛනය

04. (අ) සමානව ලාභලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන සරණි, වරුණි හවුල් ව්‍යාපාරයට 2020.04.01 දින මධුරි බඳවා ගන්නා ලදී. 2021.03.31 න් අවසන් වසර සඳහා හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුම පහත දැක්වේ.

www.questionbank.lk

	සරණි	වරුණි	මධුරි		සරණි	වරුණි	මධුරි
ගැනිලි	200	220	140	ශේෂය ඉ/ගෙ	500	300	-
ශේෂය ප/ගෙ	580	280	95	වේතන	-	-	175
				ප්‍රාග්ධන පොලී	100	80	-
				ලාභ කොමිස්	180	120	60
	780	500	235		780	500	235

අතිරේක තොරතුරු

I. මධුරි බැඳුන දින ව්‍යාපාරයට රැගෙන ආ මුදල රු. 550,000 ක් වූ අතර, එයින් රු. 50,000 ක් කීර්තිනාමය සඳහා වේ.
II. කීර්තිනාමය සම්බන්ධ ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුලින් සිදුකල යුතුය.
III. ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත වාර්ෂික ප්‍රාග්ධන පොලී අනුපාතය 10% කි.
IV. 2021.01.01 මධුරි ව්‍යාපාරයට සපයා ඇති ණය මුදල රු. 400,000 කි. පොලී පිළිබඳ එකගතාවකට පත්ව නොමැති බැවින් ණය පොළී සටහන් කර නැත.
V. වර්ෂය තුල සරණි, වරුණි, මධුරි රු. 20,000 බැගින් ගැනිලි ලබාගෙන ඇත. ඒ පිළිබඳ කිසිදු සටහනක් නැත.

අවශ්‍ය වන්නේ,

www.questionbank.lk

1. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ලාභ විසර්ජනය දැක්වෙන ප්‍රකාශනයක්
2. ඉහත අතිරේක තොරතුරු සැලකිල්ලට ගනිමින් 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජංගම ගිණුම් සහ ප්‍රාග්ධන ගිණුම්

(ආ) එක්සත් තරුණ සමාජ සුබසාධක සංගමයේ 2021.12.31 දිනට සකස් කරන ලද ලැබීම් හා ගෙවීම් ගිණුම පහත සඳහන් වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

ශේෂය ඉ/ගෙ	7,000	වේතන	5,000
ඇතුලත් වීමේ ගාස්තු	1,600	ලිපිද්‍රව්‍ය	1,400
සාමාජික මුදල්	18,400	දුරකථන වියදම්	2,500
විවිධ පරිත්‍යාග	7,200	කුලී හා වරිපනම්	4,600
ආයෝජන පොළී ආදායම	1,000	තැපැල් වියදම්	1,300
		විවිධ වියදම්	2,100
		ශේ/ප/ගෙ	18,300
	35,200		35,200

අමතර තොරතුරු වශයෙන් පහත දැ ඔබට සපයා ඇත.

I. ආයෝජන පොළී ආදායම තුළ ගිය වර්ෂයේ දී ලැබිය යුතුව ඇති රු. 200 ක පොළී ආදායමක් මේ වර්ෂය තුළ දී ලැබී ඇත.
II. 2021.12.31 දිනට ගෙවිය යුතු හා ඉදිරියට කල යුතු වියදම් පහත වේ.
   - ගෙවිය යුතු තැපැල් වියදම රු. 500
   - ගෙවිය යුතු කුලී හා වරිපනම් රු. 1,700
   - ඉදිරියට කල දුරකථන වියදම් රු. 1,500
III. ඉහත ලද සාමාජික මුදල් තුල 2020 වර්ෂය තුලදී ලැබිය යුතුව පැවති රු. 1,000 ක් ද ඇතුලත්ය. 2021 දී 2021 වෙනුවෙන් ලද සාමාජික මුදල රු. 7,600 කි. මෙම වර්ෂය අවසානයේ දී ලැබිය යුතු සාමාජික මුදල රු. 1,800 කි.

www.questionbank.lk

IV. ගිණුම් කාලපරිච්ඡේදය ආරම්භයේ පැවති අනෙකුත් ලෙජර ගිණුම්වල ශේෂයන් පහත දැක්වේ.

- සමාජ ශාලාවේ දී ජංගම නොවන වත්කම් රු. 72,900 (පිරිවැය :- 96,000)
- ආයෝජන රු. 20,000

V. ඇතුලත් වීමේ ගාස්තු ලද වර්ෂයේ ආදායම් ලෙස සලකනු ලැබේ.

www.questionbank.lk

VI. ජංගම නොවන වත්කම් සරල මාර්ග ක්‍රමයට ක්ෂය ක්‍රමය යටතේ 10% ක් ක්ෂය කරනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

1. 2021.01.01 දිනට සමුච්චිත අරමුදල
2. 2021.12.31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා අතිරික්තය හෝ හිගය
3. 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

05. (අ) 2021.03.31 දිනට සහ 2020.03.31 දිනට සීමිත බෝවත්ත පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දී ඇත.

විස්තරය	**2021.03.31 දිනට (රු'000)**	**2020.03.31 දිනට (රු'000)**
දේපළ පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම	28,000	19,000
තොග	9,680	8,800
වෙළඳ ලැබිය යුතු දෑ	9,500	10,500
මුදල් හා මුදල් සමාන දෑ	5,020	2,200
මුළු වත්කම්	52,200	40,500
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්	22,800	18,000
ප්‍රත්‍යාගණන සංචිතය	2,000	-
රඳවාගත් ඉපැයුම්	5,200	2,500
දිගුකාලීන ණය	10,500	10,100
වෙළඳ ගෙවිය යුතු දෑ	8,600	8,100
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන	500	400
බැංකු අයිරාව	2,600	1,400
මුළු හිමිකම් සහ වගකීම්	52,200	40,500

අතිරේක තොරතුරු

I. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර සහ බදු පසු ලාභ පිළිවෙළින් රු. 6,000,000 ක් සහ රු. 4,500,000 ක් විය.

www.questionbank.lk

II. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිගුකාලීන ණය මත මුළු පොලී වියදම රු. 600,000 ක් විය. මෙහි උපචිත පොලිය රු. 400,000 ක් වන අතර එය වැරදීමකින් 2021.03.31 දිනට දිගුකාලීන ණය ශේෂයට එකතු කර ඇත.

III. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම රු. 1,250,000 ක් විය. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී නව මෝටර් රථයක් අත්පිට මුදලට මිලදීගත් අතර ඊට අමතරව ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් අතිරික්තයක් ද ඇති විය. වර්ෂය තුළදී වෙනත් කිසිදු දේපල, පිරියත හා උපකරණ අත්පත් කරගැනීමක් හෝ ඉවත් කිරීමක් හෝ නොමැත.

IV. වර්ෂය තුළදී සමාගම විසින් ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් කරන ලද අතර 2021.01.01 දින සාමාන්‍ය කොටස්කරුවන්ට අතුරු ලාභාංශයක් ගෙවන ලදී.

V. දිගුකාලීන ණය 2023.03.31 දින සිට ගෙවිය යුතු වේ.

අවශ්‍ය වන්නේ,

1. LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ ගණනය කිරීමට වක්‍ර ක්‍රමය භාවිතා කරන්න)

(ආ) සීමාසහිත දේශාන් (පෞද්ගලික) සමාගමේ 2021.07.01 දින බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය (බැර) රු. 32,000 ක් විය.

- ජූලි මාසය තුළදී බැංකු ප්‍රකාශනයට අනුව මුළු හර කිරීම්වල වටිනාකම රු. 140,000 ක් වූ අතර මුළු බැරකිරීම් වල වටිනාකම රු. 190,000 ක් විය.

www.questionbank.lk

- බැංකු ප්‍රකාශනයේ හර කිරීම්වල පහත අයිතම ඇතුළත් වී තිබූ අතර ඒවා සමාගමේ මුදල් පොතේ වාර්තා වී නොතිබුණි.

www.questionbank.lk
www.questionbank.lk

	රු.
බැංකු ගාස්තු	3,000
ස්ථාවර නියෝග ගෙවීම් - රක්ෂණය	10,000

- බැංකු ප්‍රකාශනයේ බැර කිරීම්වල පහත අයිතම ඇතුළත් වී තිබූ අතර ඒවා සමාගමේ මුදල් පොතේ වාර්තා වී නොතිබුණි.

	රු.
ණයගැති ප්‍රේෂණ	12,000
ස්ථාවර තැන්පතු පොළිය	8,000

- 2021.07.01 දිනට නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් හා තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් නොපැවතුණි.
- 2021.07.31 දිනට නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු. 16,000 ක් වූ අතර උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකමරු. 23,000 ක් විය.
- 2021 ජූලි මාසයේදී බැංකු ගිණුමට මුදල් තැන්පත් කිරීමක් සිදුව නැත.

අවශ්‍ය වන්නේ,

1. 2021 ජූලි මාසය සඳහා සමාගමේ මුදල් පොත් (බැංකු ගිණුම්) පිළියෙල කිරීම (සංශෝධනයට පෙර)
2. 2021.07.31 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය
3. 2021.07.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය

06. (අ) සමාගමක් පවතින යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සලකා බලමින් සිටියි.

ව්‍යාපෘති ආරම්භයේ ඇතිවන මුදල් ප්‍රවාහයන්

www.questionbank.lk

- නව යන්ත්‍රයේ ගැනුම් මිල රු. 450,000
- සවිකිරීමේ පිරිවැය රු. 50,000
- පවතින යන්ත්‍රය විකිණිය හැකි මිල රු. 40,000

ක්ෂයද ඇතුලත් මෙහෙයුම් මුදල් ප්‍රවාහ

වර්ෂය	**1**	**2**	**3**	**4**
විකුණුම් වල අපේක්ෂිත වැඩිවීම (රු.)	600,000	750,000	700,000	800,000
මෙහෙයුම් වියදම් වල අපේක්ෂිත වැඩිවීම (රු.) (ක්ෂයද ඇතුලත්ව)	500.000	400,000	550,000	675,000

වෙනත් තොරතුරු:

I. ව්‍යාපෘතිය සඳහා රු.130,000 ක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. කාරක ප්‍රාග්ධනයේ මුළු වටිනාකම ව්‍යාපෘතිය අවසානයේදී උපලබ්ධි වේ.

II. සමාගමේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 15% කි.

කාලය/ වසර	1	2	3	4
වට්ටම් සාධකය	0.87	0.76	0.66	0.57

අවශ්‍ය වන්නේ,

1. සෑම වර්ෂයක් සඳහාම ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය
2. ශුද්ධ වර්තමාන අගයට අනුව ආයෝජනය සිදුකිරීම පිලිබඳ ඔබගේ නිර්දේශය

www.questionbank.lk

(ආ) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත උපුල් පොදු සමාගම හා බැඳේ.

දළ ලාභ අනුපාතය	20%
වත්කම් පිරිවැටුම් අනුපාතය	වාර 0.5

තොග පිරිවැටුම් අනුපාතය	වාර 8
සාමාන්‍ය තොගය	රු. 400,000
කාලච්ඡේදයේ මුළු වියදම	රු. 3,600,000
2021.03.31 දිනට මුළු වගකීම්	රු. 4,400,000

අවශ්‍ය වන්නේ,

www.questionbank.lk

1. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම්
2. 2021.03.31 දිනට මුළු වත්කම්
3. හිමිකම් මත ඉපැයුම් අනුපාතය
4. හිමිකම් අනුපාතය

www.questionbank.lk

ආදර්ශ පිලිතුරු - I පත්‍රය

(1)	3)	**(11)**	2)	**(21)**	3)
(2)	1)	**(12)**	3)	**(22)**	2)
(3)	1)	**(13)**	4)	**(23)**	3)
(4)	4)	**(14)**	3)	**(24)**	2)
(5)	3)	**(15)**	1)	**(25)**	1)
(6)	1)	**(16)**	1)	**(26)**	2)
(7)	3)	**(17)**	1)	**(27)**	2)
(8)	4)	**(18)**	1)	**(28)**	2)
(9)	4)	**(19)**	2)	**(29)**	4)
(10)	4)	**(20)**	2)	**(30)**	4)

(31) රු. 990,000 b. රු. 325,000

(32) 1. 8000
2. 6800

(33) (1) පිටි, බිත්තර, බටර්, සීනි
(2)මුරකරු වැටුප්/සුපරීක්ෂක වැටුප්
(3) විදුලි බිල්/දර/පෝරණුව
නඩත්තුව/උපකරණ ක්ෂය
(4) යීස්ට්/රසකාරක/සීනි/ලුණු

(34) 1. ගනුදෙනුවක සත්‍යතාවයට ලිඛිත සාක්ෂියක් හඳුනා ගත හැක.
2. ගනුදෙනුවක් මූලික පොත් වල වාර්තා කිරීම පසු අවස්ථා වලට කල් දැමිය හැක.
3. ගනුදෙනුවක ආරම්භක ලියවිල්ලක් වේ.
4. ගනුදෙනුවක වගකීම නිශ්චිත පාර්ශවයක් වෙත පැවරිය හැකි වීම.

(35) **පදනම** - උපචිත සහ මුදල්

සපයන තොරතුරු වල ස්වභාවය කාර්යසාධනය පිළිබඳ තොරතුරු සහ මුදල් තත්ත්වයේ වෙනස්වීම් පිළිබඳ තොරතුරු

(36) A -වැඩි වේ .B -අඩු වේ .C -වැඩි වේ .D -අඩු වේ.

(37) අ) රු. 100,000 (ආ) රු. 3,200,000

(38) A - අසත්‍ය, B - සත්‍ය, C - අසත්‍ය, D - සත්‍ය

(39) ආයතනයේ ස්කන්ධය ප්‍රාග්ධනය සහ ණය ලබාගැනීම්වල ප්‍රමාණය හා අන්තර්ගතය වෙනස්වීමට හේතුවන ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස නිර්වචනය කෙරේ.

(40) අ(රු. 120,000 (ආ) රු. 110,000

(41) රු. 26,200

(42) රු. 94,000

(43) 1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් ඉල්ලා ඇති විටදී

(44)

අවස්ථා	ගිණුම්කරණ සංකල්පය
A වසර අග අමුද්‍රව්‍ය තොගය එහි පිරිවැය සහ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මිනුම් කිරීම.	ආරක්ෂණ/විචක්ෂණ
B සෑම ගිණුම් කාලච්ඡේදයක් සඳහා ම නිශ්පාදන ගිණුමක් පිළියෙල කිරීම.	කාලච්ඡේද
C භාණ්ඩ භාරදීමට පෙර ගනුදෙනුකරුවකුගෙන් ලද අත්තිකාරමක් වගකීමක් ලෙස හඳුනා ගැනීම.	උපචිත/උපලබ්ධි /ආදයම්
D යන්ත්‍රයක් මත වෙන් කරන ලද ක්ෂය, නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් ලෙස නිෂ්පාදන ගිණුමෙහි හඳුනා ගැනීම.	ගැළපුම්

(45))අ.(රු 1,000,000 (ආ) රු 1,410,000

(46) A - අසත්‍ය, B-අසත්‍ය, C - අසත්‍ය, D - සත්‍ය

(47) (අ) රු. 70,000
(ආ) රු. 40
(ඉ) රු. 210,000

(48) රු. 137,000 වේ.

(49) A -වැඩි වේ .B -වැඩි වේ . C -අඩු වේ
D -වෙනස් නොවේ

(50) (අ). වර්ෂ - 04
(ආ). 16%

www.questionbank.lk

ආදර්ශ පිලිතුරු - II පත්‍රය

සීමිත විරාජනි පොදු සමාගමේ

01. **2021.03.31 දිනෙන් අවසන් වර්ෂයේ**

ලාභ අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (රු.000)

විකුණුම්		6,000
විකුණුම් පිරිවැය		(3,260)
දල ලාභය		2.740
වෙනත් ආදායම්		84
ආයතනික හා පරිපාලන		(988.5)
විකුණුම් හා බෙදාහැරීම්		(215)
මූල්‍ය වියදම්		(117.5)
වෙනත් වියදම්		(100)
බදු පෙර ලාභය		1,403
ආදායම් බදු		(566.5)
කාලච්ඡේදයේ ලාභය		836.5
වෙනත් විස්තීර්ණ ආදායම්		
ප්‍රත්‍යාගණන ලාභ		170
මුළු විස්තීර්ණ ආදායම		1,006.5

සීමිත විරාජනි පොදු සමාගමේ

2021.03.31 දිනෙන් අවසන් වර්ෂයේ

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

	සා.කො.	ව.කො.	ප්‍රත්‍යාගණන සංචිතය	පොදු සංචිතය	රඳවාගත් ලාභ
ඉ/ගෙ	5,000			500	300
පසුගිය වර්ෂ වැරදි					360
ඉ/ගෙ	5,000	-	-	500	660
ගො/නැ ප්‍රත්‍යාගණනය			170		
පොදු සංචිතයට මාරු කි.				100	(100)
වර්ෂයේ ලාභය					836.5
ලාභාංශ - සා.කො.					(200)
	5,000		170	600	1,196.5

www.questionbank.lk

සීමිත විරාජනී පොදු සමාගමේ
2021.03.31 දිනෙන් අවසන් දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (රු.000)

www.questionbank.lk

ජංගම නොවන වත්කම්		
දේපළ පිරියත උපකරණ	1,710	
භාවිත අයිතිය ඇති වත්කම්	937.5	
10% ආයෝජන	560	3,207.5
ජංගම වත්කම්		
අවසන් තොගය	990	
ණයගැතියෝ	2,043	
ලැ/යු ආයෝජන ආදායම්	59	
ඉදිරියට ගෙවූ වියදම්	57.5	
බැංකු හා මුදල්	3,732.5	6,882
		10,089.5
ප්‍රාග්ධනය හා වගකීම්		
සා.කො.	5,000	
පොදු සංචිතය	600	
ප්‍රත්‍යාගණන සංචිතය	170	
රඳවාගත් ඉපයුම්	1,196.5	6,966.5
ජංගම නොවන වගකීම්		
කල් බදු ණයහිමියෝ	430	
20% ණයකර	1,000	1,430
ජංගම වගකීම්		
කල්බදු වත්කම ගෙවා ඉවත් කිරීමට අදාල වගකීම	250	
කල්බදු ණයහිමියෝ - ජංගම	170	
කල්බදු ණය පොලී	17.5	
ගෙවිය යුතු EPF	75	
ගෙවිය යුතු ETF	9	
වෙළඳ ගෙවිය යුතු	800	
ගෙ/යු ණයකර පොලී	25	
ගෙ/යු ආදායම් බදු	346.5	1,693
		10,089.5

සටහන 01

ආරම්භක තොගය	400,000
ගැණුම්	4,000,000
	(100,000)
අවසන් තොගය	(1,040,000)
	3,260,000

සටහන 02

පිරිවැය	1,000,000
ක්ෂය	(62,500)
	937,500

www.questionbank.lk

සටහන 03

www.questionbank.lk

www.questionbank.lk

	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් රථ	ලී බඩු
ඉ/ගෙ	1,000	500	800	120
මහ හැරුණු මෝ/ර			400	
මෝ/ර විකුණුම්			(437.5)	
ප්‍රත්‍යාගණනය		170		
	1,000	670	762.5	120
ක්ෂය		200	420	20
මහ හැරුණු මෝ/ර ක්ෂය			40	
මෝ/ර විකුණුම්			(87.5)	
වාර්ෂික ක්ෂය		134	98	18
		334	470.5	38
	1,000	336	292	82

02. (අ)

පිරිවැය	පිරිවැය පදනම	මුළු පිරිවැය	නිෂ්පාදන දෙ. P	නිෂ්පාදන දෙ. Q	ගබඩාව
උපකරණ ක්ෂය	පොත් අගය	12,000	6,000	4,000	2,000
ගො/නැ. කුලී	භූමි වර්ගඵල	10,000	3,000	4,000	3,000
ආපනශාලා	සේවක සංඛ්‍යාව	9,000	4,000	3,000	2,000
වරිපනම්	වර්ගඵලය	1,000	300	400	300
තත්ව පාලන	තත්ව පරීක්ෂා	5,000	2,000	3,000	-
වායු සමන	වර්ග ඵලය,	7,800	2,340	3,120	2,340
සේවක රක්ෂණ	සේවක සංඛ්‍යාව	18,000	8,000	6,000	4,000
විදුලි ගාස්තු	විදුලි බුබුළු	2,000	6,000	8,000	6,000
බලය	යන්ත්‍ර ධාරිතව	5,000	3,000	2,000	-
කලමණාකරන වැටුප්	සේවක සංඛ්‍යාව	27,000	12,000	9,000	6,000
			15,384	10,256	(25,640)
			62,024	52,776	

www.questionbank.lk

(ආ) (1)

		එකතු කිරීම්			අඩු කිරීම්			සේවා	
නම	මුලික වැටුප	අතිකාල	පැමිණීමේ දීමනා	දල වැටුප	**EPF**	අත්තිකාරම්	ශුද්ධ වැටුප	**EPF**	**ETF**
නිම්ෂි	40,000	21,000	5,000	66,000	3,200	16,000	46,800	4,800	1,200
නිෂිනි	40,000	22,000	5,000	67,000	3,200	12,000	51,800	4,800	1,200
සිතුමි	40,000	15,000	-	55,000	3,200	13,000	38,800	4,800	1,200

(2)

වැටුප් වියදම = 206,000

www.questionbank.lk

දල වැටුප = 188,000
EPF වියදම = 14,400
ETF වියදම = 3,600
206,000

(3)

ගෙ/යු EPF ගිණුම

මුදල්	24,000	ඉ/ගෙ	24,000
		සේව්‍ය	14,400
		සේවක	9,600
ප/ගෙ	24,000		
	48,000		48,000

ගෙ/යු ETF ගිණුම

මුදල්	3,600	ඉ/ගෙ	3,600
		සේව්‍ය	3,600
ප/ගෙ	3,600		
	7,200		7,200

වැටුප් පාලන

ගෙ/යු වැටුප්	137,000	දල වැටුප්	188,000
ගෙ/යු EPF	9,600		
අත්තිකාරම්	41,000		
	188,000		188,000

ගෙ/යු වැටුප් ගිණුම

මුදල්	145,500	ඉ/ගෙ	145,500
		වැටුප්	137,400
ප/ගෙ	137,400		
	282,900		282,900

03. (අ)

www.questionbank.lk

01. (000)

	කා.උප	+	තොග	+	ලැ/යුතු	+	බැංකු	=	ගෙ/යුතු(VAT)	+	වෙ/ගෙ/යුතු	+	හිමිකම
	250	+	50	+	30	+	80		10	+	20	+	380
1						+	105		5			+	100
2		+	20							+	20		
3		+	(10)								(10)		
4					(10)	+	9						(1)
5	50 (1) (8)	+					(50)						(1) (8)
6													4 (4)
7					21				1				20
8							(18)				(20)	+	2
9						+	1					+	1
10							(1)					+	(3) 2
	292	**+**	**60**	**+**	**41**	**+**	**126**		**16**	**+**	**10**	**+**	**493**

02.

ශුද්ධ ලාභය = (අග හිමිකම - මුල හිමිකම) + ගැනිලි - අමතර ප්‍රාග්ධනය

www.questionbank.lk

= (492,000 – 380,000) - 2,000

= 112,000 – 2,000

ශුද්ධ ලාභය = 110,000

(ආ)

01.

ණයගැති පාලන ගිණුම

ශේෂය ඉ/ගෙ	80,000	මෝටර් රථ විකුණුම්	40,000
විකුණුම්	4,500	ආපසු එවුම්	2,500
බැංකු අගරු චෙක්	3,000	බොල්ණය	8,000
අහිමි කළ වට්ටම්	1,000	ශේෂය ප/ගෙ	38,000
88,500	88,500		88,500

02.

www.questionbank.lk

ණයගැති සැසඳුම් ප්‍රකාශනය (රු.)

සංශෝධිත ණයගැති පාලන ගි. ශේෂය		38,000
+ මගහැරුණු බැර ශේෂය	500	
පියුමිගෙන් ලද මුදල	1,800	
ආපසු එවුම්	2,500	
බොල් ණය	8,000	12,800
(-) මගහැරුණු හර ශේෂය	5,000	
කසුනිට විකුණුම්	4,500	(9,500)
ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව		41,300

04. (අ)

www.questionbank.lk

ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශය (,000)

ගණනය කර ඇති ලාභය		715
+ භාණ්ඩ ගැනිලි	60	
- ණය පොලී	-5	
නිවැරදි ලාභය		770

ලාභලාභ විසර්ජන ගිණුම (,000)

ලාභය		770
ප්‍රාග්ධන පොලී - S	100	
W	80	
	50	(230)
		540
වේතන - M	175	(175)
		365
ලාභ කොටස - S	182.5	
W	121.6	
M	60.9	(365)
		-

ජංගම ගිණුම (,000)

	S	W	M		S	W	M
ගැනිලි	200	220	140	ඉ/ගෙ	500	300	
ගැනිලි	20	20	20	ප්‍රාග්ධන පොලී	100	80	50
				වේතන			175
				ලාභ කොටස්	182.5	121.6	60.9
ප/ගෙ	562.5		125.9				
	782.5	261.6	285.9		782.5	501.6	285.9

ප්‍රාග්ධන ගිණුම (,000)

	S	W	M		S	W	M
				ඉ/ගෙ	1,000	800	
කීර්තිනාමය			50	ප්‍රාග්ධන පොලී			550
				කීර්තිනාමය	25	25	
ප/ගෙ	1,025	825	500				

	1,025	825	550		1,025	285	550

www.questionbank.lk

(ආ)

තත්ව විස්තරය

	හර	බැර
මුදල්	7,000	
ලැ/යු පොලී	200	
ලැ/යු සාමාජික මුදල්	1,000	
ජංගම නොවන වත්කම්	72,900	
ආයෝජන	20,000	
සමුච්චිත අරමුදල		101,100
	101,100	101,100

ආදායම් වියදම් ගිණුම

තැපැල් වියදම	1,800	පොලී ආදායම	800
අතිරික්ත /ඌණතාව	6,300	සාමාජික මුදල්	8,400
දුරකථන වියදම්	1,000	ඇතුලත් වීමේ ගාස්තු	1,600
ක්ෂය	9,600	විවිධ පරිත්‍යාග	7,200
වේතන	5,000		
ලිපිද්‍රව්‍ය	1,400		
විවිධ වියදම්	2,100		
		ඌණතාව	9,200
	27,200		27,200

www.questionbank.lk

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

සමුච්චිත අරමුදල	101,100	<u>ජංගම නොවන වත්කම්</u>	
අතිරික්ත /ඌණතාව	(9,200)	දේ.පි.උ	63,300
		ආයෝජන	20,000
<u>ජංගම නොවන වගකීම්</u>		<u>ජංගම වත්කම්</u>	
		දුරකථන වියදම්	1,500
<u>ජංගම වගකීම්</u>		ලැ/යු සාමාජික මුදල්	1,800
ගෙ/යු තැපැල්	500	මුදල්	18,300
කුලී හා වරිපනම්	1,700		
	104,900		104,900

05. (අ)

www.questionbank.lk

www.questionbank.lk

සීමිත බෝවත්ත පොදු සමාගම

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (රු.000)

මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ		
බදු පෙර ලාභය		6,000
ගැලපුම්		
ක්ෂය	1,250	
පොලී වියදම්	600	1,850
ගැලපීම්වලට පසු ලාභය		7,850
කාරක ප්‍රාග්ධන සංචලන		
තොග වැඩි වීම	(880)	
වෙළඳ ලැබිය යුතු දෑ අඩු වීම	1,000	
වෙළඳ ගෙවිය යුතු දෑ වැඩි වීම	500	620
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල්		8,470
ගෙවූ පොලී	(200)	
ගෙවූ බදු	(1,400)	(1,600)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල්		6,870
ආයෝජන ක්‍රියාකාරකම්වලින් යෙදවූ මුදල් ප්‍රවාහ		
මෝටර් රථ ගැනුම්	(8250)	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් යෙදවූ ශුද්ධ මුදල්		(8,250)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ		
කොටස් නිකුත් කිරීම	4,800	
ලාභාංශ ගෙවීම	(1,800)	3,000
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල්		
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම		1,620
2020.04.01 මුදල් හා මුදල් සමාන දෑ	2,200	
බැංකු අයිරාව	(1,400)	800
2021.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ		
මුදල් හා මුදල් සමාන දෑ	5,020	
බැංකු අයිරාව	(2,600)	2,420

(ආ)

සංශෝධනයට පෙර මුදල් පොත

ඉ/ගෙ	32,000	නිකුත් කල චෙක්පත්	143,000
තැන්පත් කල චෙක්පත්	193,000	ප/ගෙ	82,000
	225,000		225,000

සංශෝධිත මුදල් පොත

ඉ/ගෙ	82,000	බැංකු ගාස්තු	3,000
ප්‍රේෂණ	12,000	ස්ථාවර නියෝග	10,000
පොලිය	8,000	ප/ගෙ	89,000
	102,000		102,000

බැංකු සැසදුම් ප්‍රකාශය

සංශෝධිත මුදල් ශේෂය + ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත්	16,000	89.000
- තැන්පත් කල උපලබ්ධි නොවූ චෙක්පත්	(23,000)	(7,000)
බැංකු ප්‍රකාශයේ ශේෂය		82,000

www.questionbank.lk

06. (අ)

www.questionbank.lk

01.

විස්තරය	වර්ෂය				
	0	**1**	**2**	**3**	**4**
විකුණුම් වල අපේක්ෂිත වැඩිවීම		600,000	750,000	700,000	800,000
නව යන්ත්‍රය	(500,000)				
මෙහෙයුම් වියදම් (ක්ෂය හැර)		(375,000)	(275,000)	(425,000)	(550,000)
පැරණි යන්ත්‍ර විකුණුම්	40,000				
ව්‍යාපෘතියේ අවසානයේ කාරක ප්‍රාග්ධනය	(130,000)				130,000
ශුද්ධ මුදල් ප්‍රවාහය	590,000	225,000	475,000	275,000	380,000
ශුද්ධ වර්තමාන අගය	(590,000)	195,750	361,000	181,500	216,600

02. NPV - 364,853

ශුද්ධ වර්තමාන අගය ධන අගයක් ගැනීම නිසා ආයෝජනයට සුදුසු වේ

www.questionbank.lk

(ආ)

01.

තොග පිරිවැටුම් අනුපාතය = $\frac{\text{විකුණුම් පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$

8 = $\frac{3,200,000}{400,000}$

විකුණුම් = $\frac{3,200,000}{80\%}$

රු.4,000,000

02.

2021.03.31 දිනට මුළු වත්කම්,

www.questionbank.lk

වත්කම් පිරිවැටුම් අනුපාතය = $\frac{\text{විකුණුම්}}{\text{මුළු වත්කම්}}$

0.5 = $\frac{4,000,000}{\text{මුළු වත්කම්}}$

රු. 8,000,000

03.

හිමිකම මත ඉපැයුම් අනුපාතය

www.questionbank.lk

$$\text{හිමිකම මත ඉපැයුම් අනුපාතය} = \frac{\text{ශුද්ධ ලාභය x 100}}{\text{හිමිකම}}$$

$$= \frac{400,000 \times 100}{3,600,000}$$

$$= 11.11\%$$

04.

$$\text{හිමිකම මත ඉපැයුම් අනුපාතය} = \frac{\text{හිමිකම x 100}}{\text{මුළු ප්‍රාග්ධනය}}$$

$$= \frac{3,600,000 \times 100}{8,000,000}$$

$$= 45\%$$

THE LARGEST COLLEGE FOR ACCA IN SRI LANKA
FOR THE YEAR 20/21 WITH THE HIGHEST STUDENT ENROLMENT
ACHIEVERS®
WHERE THE GOOD BECOMES GREAT
APPROVED LEARNING PARTNER ACCA Gold
MULTIPLE
QUALIFICATIONS
IN JUST
2 1 2 YEARS
AT THE
LARGEST COLLEGE
FOR ACCA
AC A DIPLOMA IN ACCOUNTING & BUSINESS
WIT IN 6 MONTHS
ADVA CED DIPLOMA IN ACCOUNTING & BUSINESS
WIT IN 1 1 2 YEARS
BSC ONS IN APPLIED ACCOUNTING
OXFORD BROOKES UNIVERSITY
WIT IN 2 YEARS
AC A PASSED FINALIST
WIT IN 2 1 2 YEARS
F R MORE INFO
0 77 895 900
N . 39, Bauddhaloka Mw, Colombo -04
w w.achieverslive.com

Premier Partners
CONNECT WITH ACCA,
CONNECT WITH THE WORLD!
ACCA AT PPIM
HIGHLY SKILLED AND FRIENDLY TEAM OF EXPERT LECTURERS WITH 21 SRI LANKAN PRIZES AND ONE WORLD PRIZE
ONLY INSTITUTE TO PROVIDE ACCA UK REGISTRATIONS FREE
SECURING PPIM STUDENTS WITH JOB PLACEMENTS THROUGH PREMIER PARTNERS CLASSROOM TO BOARDROOM INITIATIVE
Diploma
Diploma in 6 months- awarded by ACCA UK
Degree
BSc. (Hons) in Applied Accounting (UGC recognised) in 1.5 years
PREMIER PARTNERS
10 A, DEANSTON PLACE,
COLOMBO-03, SRI LNAKA
Call / Whatsapp
077 711 7067
LICENSED ACCA CBE CENTRE
SILVER LEARNING PARTNER ACCA


ICON BUSINESS SCHOOL
DONE WITH YOUR A/L?
JOIN NOW FOR OUR NEW
ACCA FOUNDATION
INTAKE AND GET
50% DISCOUNT
ONLINE CLASSES
APPROVED LEARNING PARTNER ACCA Gold
APPROVED EMPLOYER ACCA
LICENSED CBE CENTRE ACCA
0770 552 555
0772 402 342
19, Deal Place, Colombo 03
www.icon.edu.lk
info@icon.edu.lk
ICON - THE MARKET LEADER FOR ACCA IN SRI LANKA

OBTAIN ACCA - THE BEST ACCOUNTING & FINANCE QUALIFICATION IN THE WORLD
FROM THE BEST LECTURERS IN SRI LANKA
Also obtain a Degree from Oxford Brookes University, UK, giving you
TWO WORLD RECOGNISED QUALIFICATIONS IN TWO YEARS
at an Unbeatable Price
RECOGNIZED UGC RECOGNIZED
WHY ALPHA BUSINESS SCHOOL?
Most Qualified & Experienced Lecture Panel in Sri Lanka
Only ACCA institute in Sri Lanka with an Online Learning Platform offering the entire ACCA qualification
Individual Attention
Discounts & Free Study Material from UK
Interest Free Instalment plans
Recordings of Live Lectures
Free additional Diploma from Concordia International University, USA
Job Placements
Scholarships to follow Masters Degree
APPROVED EMPLOYER ACCA
Professional Development
SILVER LEARNING PARTNER ACCA
LICENSED CBE CENTRE ACCA
Alpha Business School
info@alphabussiness.lk
www.alphabusiness.lk
CALL US ON :
0773 654 254

ACCA
ACCA + BSc (Hons) Degree in Applied Accounting within two and a half years.
Become a globally recognised finance professional with ACCA
Register now at yourfuture.accaglobal.com
Make use of this great opportunity and expand your career mobility.
Call 0112424801 or 0773874247 for more details.
ACCA Sri Lanka, Block A, 18 Floor, 33, Parkland, Park street, Colombo 2.
Think Ahead